සැ. යු. - 2010.09.09 වැනි දින පළවූ අංක 1,671 දරන ගැසට් පත්‍රයේ I-II (අ) සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,672 - 2010 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2010.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
| --- | --- |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1642 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
| --- | --- |
| රජයේ නිවේදන ... ... ... | 1643 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1645 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 සැප්තැම්බර් මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 134

DIRF/RECT/248/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහා කෙඩෙට් නිලධාරීන් 2009.07.04 දින සිට පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති රෙජිමේන්තුව/බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමාණන් විසින් ප්‍රසාදය කළ කරනු ලැබ තිබේ.

සී/57202 කෙනි ඩිල්ෂාන් චානක ලියනගමගේ, ගජබා රෙජිමේන්තුව,
සී/57174 කෙනි රත්නායක මුදියන්සේලාගේ නුවන් දිනේෂ් රත්නායක, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය,
සී/57148 කෙනි ගුණරත්න මුදියන්සේලාගේ අනුරුද්ධ අසේල බණ්ඩාර ගුණරත්න, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57232 කෙනි කැලණියන්ගොඩ ගමගේ ගයන්ත ගුණරත්න, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57178 කෙනි සුදුහකුරුලාගේ මිලින්ද නිරෝෂණ, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57240 කෙනි පොන්සුගේ වරුණ ලක්මින් තිසේරා, ගජබා රෙජිමේන්තුව,
සී/57156 කෙනි ගම්ලත් ආරච්චි අප්පුහාමිලාගේ රසික රොෂාන් අමරතුංග, ගැමුණු හේවා බලඇණිය,
සී/57163 කෙනි චමීර දිනුවන් පලිහවඩන, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57195 කෙනි රාජකරුණා වඩනතුවක්කු සමරකෝන් වාසල මුදියන්සේලා රාළහාමිලාගේ තලීන් දම්මික සමරකෝන්, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57212 කෙනි ශිරාන් අසිත විවේකානන්ද, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57161 කෙනි රාජමන්ත්‍රී ගෙදර මංජුල ප්‍රභාත් රාජමන්ත්‍රී, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව,
සී/57192 කෙනි කංචන ඉරංග රූපසිංහ, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57210 කෙනි දොන් දුෂ්මන්ත සොමිනස් ලොකුකැටගොඩ, ගජබා රෙජිමේන්තුව,
සී/57160 කෙනි වැලිවිටිය කංකානම්ගේ සුජීව ජයනාත්, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57228 කෙනි බොළඳ හකුරු චාමර රන්දීප්, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57173 කෙනි වෙල්ගමගේ දොන් අසේල මධුරංග පෙරේරා, ගැමුණු හේවා බලඇණිය,
සී/57182 කෙනි වන්නි ආරච්චිගේ සංජීව කුමාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57191 කෙනි පොල්කැටියගේ අසංක රුවන් කුමාර, ගජබා රෙජිමේන්තුව,
සී/57231 කෙනි සෙනරත්න මුදියන්සේලාගේ සංජය ප්‍රදීප් කුමාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57151 කෙනි ලියන මොහොට්ටිගේ රොෂ්මල් නිලුක් පැට්‍රික් කබ්රාල්, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව,
සී/57157 කෙනි රත්නායක මුදියන්සේලාගේ අසංක බණ්ඩාර රත්නායක, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57187 කෙනි හේවා බෝදරගේ මංජුල උදය කුමාර, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57220 කෙනි මිහිරාන් මාධව කාරියප්පෙරුම, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57169 කෙනි මොරපිටියගේ ශානුක නිරෝධ උදයංග මොරපිටිය, ගැමුණු හේවා බළඇණිය,
සී/57175 කෙනි මාදම්පගේ ධනුෂ්ක සමන් කුමාර, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57164 කෙනි මනතුංග ආරච්චිලාගේ ගෙදර අමිත් නිලංග, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57180 කෙනි හේවා කුඹල්ගොඩ ගමගේ දිලීප් අසංක, ගැමුණු හේවා බළඇණිය,
සී/57209 කෙනි රණසිංහ බණ්ඩාරගේ තරිඳු සම්පත් මදුසංඛ, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57216 කෙනි මැල්ලව තන්ත්‍රිගේ අරුණ පැතුම් ලක්මාල් පෙරේරා, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය,
සී/57176 කෙනි ගාර්දියේ පුංචිහේවාගේ නදීෂාන් පුංචිහේවා, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57184 කෙනි පාලවත්ත මුදියන්සේලාගේ අමිල ප්‍රසන්න පාලවත්ත, ගැමුණු හේවා බළඇණිය,
සී/57200 කෙනි දොන් බැස්ටියන් පෙරේරා ධනුෂ්ක සම්පත් අබේගුණවර්ධන, ගජබා රෙජිමේන්තුව,
සී/57213 කෙනි ඉන්ද්‍රතිස්ස නුවන් කුමාර ප්‍රේමසිරි, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57208 කෙනි රාජපක්ෂ මුදියන්සේලාගේ දනුෂ්ක සම්පත් විජේරත්න, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය,
සී/57207 කෙනි අත්තනායක මුදියන්සේලාගේ පාලින්ද දේශප්‍රිය අත්තනායක, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57205 කෙනි සියාසිංහ පොල්ගහමුල්ලගේ චමිල් නිසාන්, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57237 කෙනි කීර්තිරත්නගේ රෝහණ පුෂ්ප කුමාර, ගජබා රෙජිමේන්තුව,
සී/57236 කෙනි රදම්පල ගමගේ ජයංගික මධුරංග, ගැමුණු හේවා බළඇණිය,
සී/57239 කෙනි විජේසිරි නවරත්න මුදියන්සේලාගේ වෙස්ලි කපිල සේනානායක, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57159 කෙනි කළුතන්ත්‍රිගේ දුමින්ද තුෂාන් පෙරේරා, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57150 කෙනි හීරලු අප්පුහාමිලාගේ මදුරංග දේශාන් කරුණාතිලක, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57226 කෙනි වර්ණකුලසූරිය චානුක ධනංජය පෙරේරා, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව,
සී/57196 කෙනි විජේසිංහ ආරච්චිලාගේ සනත් නිරංග, ගජබා රෙජිමේන්තුව,
සී/57186 කෙනි කහඳ ආරච්චිගේ දිනේෂ් චානක ගුණරත්න, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57227 කෙනි විතාරණගේ අසංක, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57203 කෙනි හේවා පණ්ඩිතරත්නගේ සහන් ධනංජය ප්‍රේමරත්න, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57179 කෙනි තුර්ති පද්මනාදන්ගේ චමින් මධුසංඛ, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57166 කෙනි චාමර රුක්මාල් කෝට්ටගේ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව,
සී/57177 කෙනි අමරසිංහලාගේ චන්දන රුවන් කුමාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57217 කෙනි ගමගේ අරනෝලිස් අප්පුහාමිගේ ශාන්ත කැලුම් බංඩාර, විජයබාහු පාබල රෙජිමේන්තුව,

සී/57171 කෙනි හඳුන්ගේ චාමර මනුජ ප්‍රසාද් පෙරේරා, ගැමුණු හේවා බලඇණිය,
සී/57162 කෙනි නැකැත් දුරයලාගේ ප්‍රසාද් වික්‍රමසිංහ, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57153 කෙනි තිනුක රත්නප්‍රිය සිරිවර්ධන, ගජබා රෙජිමේන්තුව,
සී/57194 කෙනි මාවිල්මඩ මුදියන්සේලාගේ චාමර මධුසංක බණ්ඩාර, ගැමුණු හේවා බලඇණිය,
සී/57234 කෙනි මුණසිංහ ආරච්චිගේ ධනුෂ්ක සමීර මුණසිංහ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව,
සී/57167 කෙනි අධිකාරි මුදියන්සේලාගේ උපුල් ශාන්ත අධිකාරි, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57165 කෙනි උඩවත්තගේ කතිෂ්ක සම්පත් ජයසිංහ, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57189 කෙනි හේවාගේ නුවන් සංජය හේවගේ, ගජබා රෙජිමේන්තුව,
සී/57225 කෙනි හේවා පෙරමුණලාගේ රොෂාන් ඉන්දික ප්‍රේමකුමාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57149 කෙනි ඉඹුල්මුරේ ලේකම්ලාගේ සමීර ධනුෂ්ක නවරත්න, ගැමුණු හේවා බලඇණිය,
සී/57188 කෙනි ආරිය කුලසිංහගේ අශෝක චන්දන කුලසිංහ, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57230 කෙනි සුජිත් ප්‍රියංකර විජේසේකර ආරච්චි, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57201 කෙනි කලිගුරාල ආරච්චිලාගේ නලින්ද සුමිත් කුමාර, ගජබා රෙජිමේන්තුව,
සී/57155 කෙනි එදිරිසිංහ ආරච්චිගේ අර්ජුන උදයංග, ශ්‍රී ලංකා සංඥා බලකාය,
සී/57204 කෙනි දෙවිපහල දුරයලාගේ අමිල නයනජිත් කරුණාරත්න, ගැමුණු හේවා බලඇණිය,
සී/57235 කෙනි වාසලවත්ති මුදියන්සේලාගේ රුවන් දුමින්ද පියමාල්, ගැමුණු හේවා බලඇණිය,
සී/57152 කෙනි ජයසිංහ ආරච්චිලාගේ නිමල්සිරි ජයසිංහ, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57199 කෙනි එගොඩ රාජපක්ෂ මහේන්ද්‍ර මධුශංක රාජපක්ෂ, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57229 කෙනි ගොඉඳු බාසුල සමරසිංහ දිසානායක, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57223 කෙනි රන්මුතුගේ සඳුන් මදුසංක, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57233 කෙනි බෝපගොඩ හෙට්ටිගේ සුරංග ජනක සම්පත්, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/58238 කෙනි හේරත් මුදියන්සේලාගේ ක්‍රිෂාන්ත සමීර හේරත්, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57218 කෙනි ගුණදාසගේ ප්‍රසාද් චතුරංග රත්නායක, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව,
සී/57215 කෙනි කන්දේ විදානෙලාගේ එරන්ද මදුසංඛ ධර්මරත්න, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57185 කෙනි තේනාහන්දි කුමාර වෛද්‍ය තනුක ඉරාන් සංජීව ද සිල්වා, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව,
සී/57181 කෙනි පිරමානගේ ඩිලාන් නිමේෂ විජයානන්ද, ගැමුණු හේවා බලඇණිය",
සී/57211 කෙනි ගමරාලලාගේ ඔෂාන් තන්ජුල පෙරේරා, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57158 කෙනි ජසෙන්තු කම්කානම්ගේ සුනෙත් සිරි චතුරංග, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57168 කෙනි මහගම රාලලාගේ දිනුෂ නිරංජන් ධර්මසේන, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57197 කෙනි රඹුක්කනගේ ගිහාන් ශෂික උක්වත්ත, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57170 කෙනි බිනෝයි සම්පත් සුරවීර, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57183 කෙනි උඩුව විදානලාගේ සමීර සිරන්ජිත් පෙරේරා, ගජබා රෙජිමේන්තුව,
සී/57198 කෙනි අසරප්පුලිගේ දුමින්ද පුෂ්පකුමාර ජයවීර, ගැමුණු හේවා බලඇණිය,
සී/57219 කෙනි මාගෙදර විතානගේ කසුන් එරංග, ගැමුණු හේවා බලඇණිය,
සී/57172 කෙනි මදුරාවෙල දොන් විතාරණලාගේ කසුන් ධනුෂ්ක මදුරාවෙල, විජයබාහු පාබල රෙජිමේන්තුව,
සී/57222 කෙනි අකිල නදීර අබේසේකර ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව,
සී/57193 කෙනි තිබ්බිරිපොල ආරච්චිලාගේ ඉඳුනිල් පුෂ්පකුමාර, ශ්‍රී ලංකා පාබල හමුදාව,
සී/57224 කෙනි තෙත්තුවලාගේ අසන්ත ලක්නාත් ජයසිංහ, ගජබා රෙජිමේන්තුව,

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09-855

# රජයේ නිවේදන

## 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2)(අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "මිද්දෙණිය පුරාණ මහා විහාරස්ථානයෙහි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සඳහා වූ අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 මාර්තු මස 31 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

### උපලේඛන

"මිද්දෙණිය පුරාණ මහා විහාරස්ථානයෙහි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සඳහා වූ අරමුදල".

09-765

---

## 2010 වාර්ෂික තොග ගණන් ගැනීම හා හරි වැරදි බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සියළුම බෙහෙත් ගබඩා වසා තැබීම

වර්ෂ 2010 දෙසැම්බර් මස 01 වැනි දින සිට 2010 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) තොග ගණන් බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සියළුම ගබඩා වසා තබනු ඇත.

අත්‍යාවශ්‍ය හදිසි ඖෂධ සහ අන්තරායක ඖෂධ හැර වෙනත් කිසිම ඖෂධයක් සඳහා එම කාල පරිච්ඡේදය තුළදී අයදුම්පත් භාර නොගන්නා

බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂකවරුන්, මහ රෝහල් අධ්‍යක්ෂකවරුන්, මධ්‍යම රජය යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂකවරුන්, ආරක්ෂක අංශ වල කාර්යභාර වෛද්‍ය නිලධාරීන් (ගුවන්, නාවික, පාබල සහ පොලිසිය) විශේෂිත ව්‍යාපෘති භාර ප්‍රධානීන් හා බෙහෙත් ශාලා භාර නිලධාරීන් වෙත මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

වෛද්‍ය කමල් ජයසිංහ,
අධ්‍යක්ෂ,
වෛද්‍ය සැපයීම් අංශය.

2010 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ 10,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
වෛද්‍ය සැපයීම් අංශයේ දී ය.

09-744

---

## ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - හගුරන්කෙත

හගුරන්කෙත ඇසල පෙරහැර - 2010

**සියලු දෙනාගේ දැනගැනීම පිණිසයි**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරිය වන්දනා ගමන් ආඥාපනතේ 02 වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයන්ට අනුව, අංක 01.563-2008 අගෝස්තු මස 15 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය* මගින් ඓතිහාසික සගරුවන්කෙත ඇසළ මහ පෙරහැර ගැසට් කරන ලද පෙරහැරක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

02. එකී නියෝග ප්‍රකාරව, 2010 වසරට අදාල ඓතිහාසික සගරුවන්කෙත ඇසළ මහ පෙරහැර 2010.09.08 දින සිට 2010.09.23 දින දක්වා පැවැත්වෙන බව සියලු දේනාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
හගුරන්කෙත.

2010.09.01

**පෙරහැර කාල සටහන**

ශ්‍රීමත් ශාලිවාහනාරූඪ ශක නෘප වර්ෂ ප්‍රමාණයෙන් 1932ක් වූ මතු විෂ්ණු විංසතියට අයත් බ්‍රහ්ම යුග පංචාබ්දයෙහි සිව්වන අනුවත්සර භේධ නාමධාරී ‘‘බ්‍රහ්ම’’ ‘‘දේවතාධි’’ ‘‘විකෘති ’’ නම් මෙම වර්ෂය වනාහි කටක රවි විසිපහ භාගවූ චන්ද්‍ර මාස ක්‍රයෙන් නිකිණි පුර පැලවිය නම් තිතියලත් කුජ දින ශුද්ධ සූර්යෝදයාදී පැය 07 විනාඩි 07 හෙවත් ව්‍යවහාර වර්ෂයෙන් 2010 වැන්නෙහි අගෝස්තු මස 10 වැනි කුජ දින නැගෙනහිර දිශාභිමුකව සිරිත් පරිදි පේකොට තබන ලද ‘‘පණස’’ වෘක්ෂයේ ශාඛාවක් ගෙන හගුරන්කෙත විෂ්ණු දේවාලයේ අළුත්නුවර පත්තිනි පත්තිනි දේවාලයන්හි පූර්වාභිමත්ව ඇසළ ‘‘කප් ’’ සිටුවීමට සුභයි.

*ඇතුල් පෙරහැර*

රාජ්‍ය වර්ෂ 2010ක් වූ සැප්තැම්බර් මස 08 වැනි බුධ දින රාත්‍රී 7 පසුවී විනාඩි 07ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර පිටත් වී දේවාලය වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 09 වැනි ගුරු දින රාත්‍රී 7 පසුවී විනාඩි 02ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර පිටත් වී දේවාලය වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 10 වැනි කිවි දින රාත්‍රී 7 පසුවී විනාඩි 18ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී දේවාලය වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 11 වැනි ශනි දින රාත්‍රී 7 පසුවී විනාඩි 22ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී දේවාලය වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 12 වැනි රිවි දින රාත්‍රී 6 පසුවී විනාඩි 48ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී දේවාලය වටා පැදකුණු කොට ගෙවදීම

*කුඹල් පෙරහැර*

සැප්තැම්බර් මස 13 වැනි සඳු දින රාත්‍රී 7 පසුවී විනාඩි 18ට උතුරු දිශාභිමුකව පෙරහැර පිටත් වී මහ මළුව වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 14 වැනි කුජ දින රාත්‍රී 7 පසුවී විනාඩි 42ට උතුර දිශාභිමුකව පෙරහැර පිටත් වී මහ මළුව වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 15 වැනි බුධ දින රාත්‍රී 7 පසුවී විනාඩි 45ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර පිටත් වී මහ මළුව වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 16 වැනි ගුරු දින රාත්‍රී 8 පසුවී විනාඩි 05ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර පිටත් වී මහ මළුව වටා පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 17 වැනි කිවි දින රාත්‍රී 7 පසුවී විනාඩි 42ට උතුරු දිශාභිමුකව පෙරහැර පිටත් වී මහ මළුව වටා පැදකුණු කොට ගෙවදීම

*රන්දෝලි බෑම*

සැප්තැම්බර් මස 18 වැනි කිවි දින අළුයම 4 පසුවී විනාඩි 55 දකුණු දිශාව බලා රන්දෝලි බෑම සුභයි.

*රන්දෝලි පෙරහැර*

සැප්තැම්බර් මස 18 වැනි ශනි දින රාත්‍රී 8 පසුවී විනාඩි 55ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී රාගල පාර, පිච්චකොටුව පාර, බොරලැස්ස පරේහි පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 19 වැනි රිවි දින රාත්‍රී 10 පසුවී විනාඩි 19ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී රාගල පාර, පිච්චකොටුව පාර, බොරලැස්ස පරේහි පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 20 වැනි සඳු දින රාත්‍රී 10 පසුවී විනාඩි 06ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර පිටත් වී රාගල පාර පිච්චකොටුව පාර බොරලැස්ස පරේහි පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 21 වැනි කුජ දින රාත්‍රී 10 පසුවී විනාඩි 04ට උතුර දිශාභිමුකව පෙරහැර පිටත් වී රාගල පාර, පිච්චකොටුව පාර, බොරලැස්ස පරේහි පැදකුණු කොට ගෙවදීම

සැප්තැම්බර් මස 22 වැනි බුධ දින රාත්‍රී 9 පසුවී විනාඩි 54ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී රාගල පාර, පිච්චකොටුව පාර, බොරලැස්ස පරේහි පැදකුණු කොට ගෙවදීම

*දියකැපුම් පෙරහැර*

සැප්තැම්බර් මස 23 වැනි ගුරු දින අළුයම 4 පසුවී විනාඩි 36ට දකුණු දිශාභිමුකව පෙරහැර පිටත් වී පාන්දර 5 පසුවී විනාඩි 36ට දකුණ දිශාභිමුකව දිය කැපීම

*දහවල් පෙරහැර*

සැප්තැම්බර් මස 23 වැනි ගුරු දින පස්වරු 3 පසුවී විනාඩි 06ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර අරත්තන විහාරයෙන් පිටත්වී වීදි සංචාරය කොට මහ මළුවේ තෙවිටක් ප්‍රදක්ෂිණාකොට පස්වරු 06 පසුවී විනාඩි 58ට නැගෙනහිර දිශාභිමුකව පෙරහැර ගෙවදීම ශුභ වේ.

වේලාවන් සහ මාර්ග වෙනස් කිරීමේ බලය බස්නායක නිලමේතුමා සතු ය.

පී. බී. ජයසුන්දර,
බස්නායක නිලමේ.

2010 අගෝස්තු මස 05 වැනි දින,
විෂ්ණු මහා දේවාලයේ දී ය.

09-921

අංකය : ප්‍ර. නො. 11/2/35/13/2010 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.09.20 වැනි දින සිට 2010.10.03 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.10.10 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "එම්" දරන කොට්ඨාසයේ 1943 වෙළුමේ 04 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව මහරගම යන ගමේ පිහිටි වරිපනම් අංක බටදොඹගහවත්ත නමැති ඉඩමෙන් මැන බෙදා වෙන් කරන ලද අ. 0, රූ. 0, පර්. 8 විශාලත්වයෙන් යුත් කැබලි අංක ඒ 3/3 දරන බිම් කොටසට සී. එච්. ජී. ප්‍රනාන්දු මානක තැනගේ 1981.09.20 දින අංක 1561 දරන පිඹුරේ ප්‍රකාර මායිම්, *උතුරට* : හයිලෙවල් පාරේ සිට නිවෙස් කරා යන පාර ; *නැගෙනහිරට* : එල්. එච්. අර්වින් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටසක් ; *දකුණට* : චාර්ලිස් පෙරේරාට අයිති ඉඩම ; *බස්නාහිරට* : කැබලි අංක ඒ 3/4, ඒ 3/2 සහ ඒ 3/1. | 1. පී. ආර්. ද ලිවේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1993.08.08 වැනි දින ලියා සහතික කරන ලද අංක 1285 දරන උකස් ඔප්පුව<br>2. එච්. ඒ. එස්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1997.10.09 වැනි දින ලියා සහතික කරන ලද අංක 15777 දරන තෑගි ඔප්පුව |

09-863

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මිනුවන්ගොඩ ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගුත්තිල පින්ඩික කාරියකරවන.

2010.01.07 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කිව්. ටී. තිසේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2003.08.06 දින සහ අංක 3484 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගුත්තිල පින්ඩික කාරියකරවන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන්ලක්ෂ

දහඅටදහස් නවසිය අනූපහයි ශත අනූඅට (රු. 13,18,995.98) ක මුදලක් 2009.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,18,995.98ක මුදලට 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3484 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාව තුළ 3 වැනි කුරන, පරාක්‍රම පාරෙහි පිහිටි "මාදන්ගහවතු කැබැල්ල" නමැති ඉඩමට බලයලත් මානක එච්. එල්. කෲස් දාබරේරා විසින් මැන සාදන ලද 1991 මැයි මස 29 වැනි දින සහ අංක 5692/1991 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට වන උතුරට : පරාක්‍රම පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 2න් ද, දකුණට : ජෝන් ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : ටී. අල්පොන්සුගේ උරුමකරුවන්ට අයත් ඉඩමෙන් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක විශාල ඉඩම තුළ ඇති සියළුම දේත් සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 231/282 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම මෑතකදී කරන ලද මැනීමකට අනුව බලයලත් මානක එම්. ජේ. එම්. ජී. ඩයස් විසින් 2002 අගෝස්තු මස 12 වැනි දින අංක 2954 දරන පිඹුර ප්‍රකාරව උතුරට : පරාක්‍රම පාරෙන් ද, නැගෙනහිරට : බලයලත් මානක එච්. එල්. කෲස් දාබරේරා විසින් 1991 මැයි මස 29 වැනි දින සහ අංක 5692/1991 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 2න් " ද, දකුණට : ජෝන් ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් ද, බස්නාහිරට : අල්පෝන්සු සුවාරිස්ගේ උරුමකරුවන්ට අයත් ඉඩමෙන් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1013/13

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අනුරාධපුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මොරතැන්නේ අල්විස්ගේ ධර්ම ශ්‍රී ජය බණ්ඩාර.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2002.06.26, 2004.05.24, 2005.10.21, 2006.06.26 සහ 2007.05.22 දිනැති සහ පිළිවෙලින් අංක 2455, 3281, 3972, 4353 සහ 4921 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොරතැන්නේ අල්විස්ගේ ධර්ම ශ්‍රී ජය බණ්ඩාර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හාරලක්ෂ හතලිස්අටදහස් දෙසීය පහයි ශත පහ (රු. 4,48,205.05) ක මුදලක් 2010.05.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,48,205.05ක මුදලට 2010.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2455, 3281, 3972, 4353 සහ 4921 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදරා කෝරළේ, කුංචිකුලම, ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 573හි කුංචිකුලමේ පිහිටි ඉඩමෙහි උතුරට : ආර්. එම්. අමරසිංහට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : රජයේ ඉඩමෙන් ද, දකුණට : පාරෙන් ද සහ බටහිරට : විජේරත්නට අයිති ඉඩමෙන් ද මායිම් වූ අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාලත්වය ඇති ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඒ 625/120 යටතේ ලියාපදිංචි කර ඇති මෙම ඉඩම ගහකොළ සහ සියළු දේත් සමග වේ. එකී ඉඩම හා ඊට අයත් සියලු දේ Anu/Mihi/Pra/1474 ප්‍රදාන ඔප්පුව මගින් ලැබී ඇත.

ඉහත ඉඩම නැවත මැනීමකට අනුව බලයලත් මානක ටී. බී. ආරියසේන විසින් 2002.06.07 දින මැන සාදන ලද අංක 1961 පිඹුරේ ලොට් අංක 1 නැමැති ඉඩමෙහි උතුරට : ආර්. එම්. අමරසිංහට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : විජේරත්නට අයිති ඉඩමෙන් ද, දකුණට : පාරෙන් ද සහ බටහිරට : පාරෙන්ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් විසිපහ (අ. 0, රූ. 2, පර්. 25)ක් විශාලත්වය ඇති ඉඩම ගහ කොළ සහ සියළු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-1013/3

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අම්බලන්ගොඩ ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඉලංදාරි දේව අසිත ධනවංස.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඕ. ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2007.03.24 දින සහ අංක 1684 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලංදාරි දේව අසිත ධනවංස යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පහළොස් ලක්ෂ හැත්තෑඅටදහස් දෙසිය අසූතුනයි ශත අසූනවය (රු. 15,78,283.89) ක මුදලක් 2009.06.03 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 15,78,283.89ක මුදලට 2010.06.04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1684 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, මාදම්පේ, ඌරවත්ත හි පිහිටි "අලගියදුරවත්ත හෙවත් ඔලබොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. වී. ගුණවර්ධන විසින් මැන සාදන ලද 1992 ජූලි මස 18 වැනි දින සහ අංක 10ඒ දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "5" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : එම ඉඩමේම ලොට් 6න් ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 4න් ද, දකුණට : අඩි පාරෙන් ද සහ මාපිනිවත්තෙන් ද, බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා දිවෙන අධිවේගී මාර්ගයෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දොලහයි දශම තුනයි හය (අ. 0, රූ. 0, පර්. 12.36) ක් විශාල ඉඩම ගාල්ල දිසා අධිකරණයේ අංක 15600 දරන නඩුවේ ගොනු කර ඇත. මෙම ඉඩම නැවත මැන බලයලත් මානක එස්. ප්‍රීති වීරවර්ධන විසින් මැන සාදන ලද 2006 අගෝස්තු මස 03 වැනි දින සහ අංක 2383 දරන පිඹුරේ දක්වා ඇත. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරුව සී 763/16හි ලියාපදිංචි කර ඇත. (මෙම ඉඩමට වැරදීමකින් දෙන ලද වෙනස් මායිම් සහිතව ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරුවේ සී 766/83හි ද ලියාපදිංචි කර ඇත).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1013/2

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරලැස්ගමුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගමගේ අජිත ධර්මප්‍රිය.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2007.03.15 දින සහ අංක 2957 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගමගේ අජිත ධර්මප්‍රිය යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හත්දහස් නවසිය පනහයි ශත අනූව (රු. 5,07,950.90) ක මුදලක් 2009.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,07,950.90ක මුදලට 2009.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2957 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි "හතරඅදහේන" නමැති ඉඩමට බලයලත් මානක පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 1026 සහ 1999 මාර්තු මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 3බී" (බලයලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2215 සහ 1993 ඔක්තෝබර් මස 29 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 3" හි උප බෙදුමක් ලෙස) ලෙස ලකුණු කර ඇති ඉඩම් කෙටසට මායිම්, උතුරට : මෙහි ලොට් 3ඒ සහ පාරෙන් ද (පිඹුරු අංක 2215ට අයත් ලොට් 2), නැගෙනහිරට : පිඹුරු අංක 2215ට අයත් ලොට් 2 සහ 4න් ද, දකුණට : පිඹුරු අංක 2215ට අයත් ලොට් 4න් ද සහ ජී. කරුණාරත්නට හිමිකම් කියන හතරඅදහේනෙන් ද සහ බස්නාහිරට : ජී. කරුණාරත්න හිමිකම් කියන හතරඅදහේනෙන්ද මායිම් වූ එකී අංක 1026 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 282/205 හි ලියාපදිංචි කර ඇත.

අංක 2215 දරන පිඹුරට අයත් ලොට් 2හි (අඩි 15ක් පළලැති පාර) වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1013/4

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරැල්ල ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී විසින් සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරැකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2008.08.18 සහ 2009.10.16 වැනි දිනැති සහ පිළිවෙලින් අංක 3236 සහ 3514 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට සහ ජයසිංහ ආරච්චිගේ ගාමිණී ජයසිංහ යන අය උකස්කරු හැටියට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී වෙත උකස්කර ඇති හෙයින්,

තව ද එකී ජයසිංහ ආරච්චිගේ ගාමිණී ජයසිංහ යන අය ඉහත කී සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් එම සමාගමේ පාලනය සහ කළමනාකරණය දරන අතර, ඒ අනුව එකී ජයසිංහ ආරච්චිගේ ගාමිණී ජයසිංහ යන අය ඉහත කී සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍ය අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර, හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. විසින් සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පිළිසරණයන්හි නියම අර්ථලාභියා එකී ජයසිංහ ආරච්චිගේ ගාමිණී ජයසිංහ යන අය වන හෙයින් ද,

හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. ට අයවිය යුතු මුදල් ආපසු ගෙවීම එකී සොෆ්ට්කොම් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ජයසිංහ ආරච්චිගේ ගාමිණී ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකසිය තුන්ලක්ෂ හැත්තෑහයදහස් තුන්සිය හතලිහයි ශත පනස්තුන (රු. 1,03,76,340.53)ක මුදලක් 2010.05.11 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,03,76,340.53ක මුදලට 2010.05.12 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3236 සහ 5314 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාර්ට් මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහ නගර සභා සීමාවේ, නාවල පිහිටි නාවල පාරේ. වැලිකඩවත්ත ටෙරස් හි වරිපනම් අංක 562/5 දරන බත්තලකුඹුර නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් 1977.09.23 දින සහතික කරන ලද අංක සීඕ 4428 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 5 දරන ඉඩම් කොටස වන උතුරට : ඇලෙන් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 6න් ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 (පාර සඳහා වෙන් කරන ලද කොටසින්) ද, සහ බටහිරට : මෙම ඉඩමේ ලොට් 4න් ද මායිම් වූ එකී අංක සීඕ 4428 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඑකයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 21.3)ක් විශාලත්වය ඇති ඉඩම සමග ගොඩනැගිලි, සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3162/130 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මෑතකදී කරන ලද මැනීමකට අනුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහ නගර සභා සීමාවේ, නාවල පිහිටි නාවල පාරේ, වැලිකඩවත්ත ටෙරස් හි වරිපනම් අංක 562/5 දරන බත්තලකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එම්. ඒ. ජයරත්න විසින් 2003.04.24 දින මැන සාදන ලද අංක 4057 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 5 දරන ඉඩම් කොටස වන උතුරට : 9 ඇලෙන් ද, (අත්හරින ලද), නැගෙනහිරට : පිඹුරු අංක පී. ජී. සී ඕ. 4428හි ලොට් 6න් ද, දකුණට : වැලිකඩ වත්ත ටෙරසයෙන් ද සහ බටහිරට : පිඹුරු අංක පිපි සීඕ 4428හි ලොට් 4න් ද මායිම් වූ එකී අංක 4057 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාලත්වය ඇති ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

ලොට් 2 තුළින් සහ සර්වේයර් ජනරාල් විසින් 1977.09.23 සහතික කරන ලද අංක සීඕ 4428 දරන පිඹුරේ දක්වා ඇති අනෙකුත් සියලු මාර්ග මතින් මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-1013/5

---

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - බොරැල්ල ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අනිල් රාජකරුණා.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2005.07.29 වැනි දිනැති සහ අංක 2493 දරන බැඳුම්කරය

යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අනිල් රාජකරුණා යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ නමදහස් අටසිය අනූඑකයි ශත හතලිස්හත (රු. 3,09,891.47) ක මුදලක් 2010.01.07 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,09,891.47ක මුදලට 2010.01.08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2493 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමාවේ, පමුණුව පිහිටි සුචරිතෝධය පාරේ, වරිපනම් අංක 23/20 දරන දෙහිගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩබ්. අබේසිංහ විසින් 1989.11.02 වැනි දින මැන සාදන ලද අංක 3424 දරන පිඹුරේ ලොට් 2සී නමැති වෙන්කළ ඉඩම් කොටස වන උතුරට : ලොට් 2බී වලින් ද, නැගෙනහිරට : ඒ. හේරස් පෙරේරාගේ ඉඩමෙන් (බලයලත් මානක එම්. බී. ද සිල්වා විසින් 1962.01.16 දින මැන සාදන ලද අංක 11092 දරන පිඹුරේ ලොට් ඒ5) ද, දකුණට : ඒබ්‍රහම් සිංඤෝගේ ඉඩමෙන් සහ පාරෙන් ද සහ බටහිරට : ලොට් 2ඩී වලින් ද, මායිම් වූ එකී අංක 3424 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1875/144හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 2493 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),<br>
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-1013/6

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ගම්පොල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පානම්බරගේ මලින් චන්දන ප්‍රනාන්දු.

2010.07.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් ටී. බී. අබේකෝන් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2007.11.28 වැනි දිනැති සහ අංක 5878 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පානම්බරගේ මලින් චන්දන ප්‍රනාන්දු යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හතලිස්අටදහස් දෙකයි ශත විසිඑක (රු. 3,48,002.21) ක මුදලක් 2010.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,48,002.21ක මුදලට 2010.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5878 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර, මැද පළාත කෝරළේ, වැගිරිය, හිටිනවත්ත හි "කොටුවේගෙදරවත්ත" නමැති ඉඩමට බලයලත් මානක බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් 2003.10.11 දින මැන සාදන ලද පිඹුරු අංක 5523හි ලොට් අංක ඒ නමැති ඉඩමෙහි උතුරට සහ ඊසානදිගට : ආර්. එම්. සෙනෙවිරත්නට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටසින් ද, දකුණට : පාරෙන් ද සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද මායිම් වූ පර්චස් එකොලහයි දශම දෙකයි එක (අ. 0, රූ. 0, පර්. 11.21)ක් හෝ හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි අටයි තුනයි පහ (හෙක්. 0.02835) විශාල මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 377/208 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),<br>
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-1013/7

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සුප්පයියා ජෙගනාතන්.

2010.07.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.10.24 දින සහ අංක 2997 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2008.12.03 දිනැති සහ අංක 3323 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුප්පයියා ජෙගනාතන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙසිය හයලක්ෂ තිස්අටදහස් අටසිය හතලිස්හයයි ශත පනහ (රු. 20,638,846.50) ක මුදලක් 2010.06.23 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 20,638,846.50ක මුදලට 2010.06.24 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2997 සහ 3323 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාවේ, වසම් අංක 19 කොච්චිකඩේ දකුණ, අලුත් යෝන් වීදිය, තුළ පිහිටි අළුත් යෝන් වීදියේ දැනට වරිපනම් අංක 158 දරන ඉඩමට බලයලත් මානක අයි. ආර්. සයිබ්‍රරන්ස් විසින් 1857.04.18 දින මැන සාදන ලද පිඹුරෙන් බෙදා වෙන් කල ඉඩම වන උතුරට : අලුත් යෝන් වීදියෙන් ද, නැගෙනහිරට : කුප්පා පුල්ලේ පකීර් තම්බිගේ නිවෙස සහ ක්‍රීඩාංගනයෙන් ද, දකුණට : තන්ජෙවූර් ලෙබ්බේගේ ගෙවත්තෙන් ද සහ බටහිරට : අසේන් මීරා ලෙබ්බේ ලෙවා කන්ඩුගේ නිවස සහ ගෙවත්තෙන්ද මායිම් වූ එකී පිඹුරු ප්‍රකාරව පර්චස් හතයි දශම එකයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 7.10)ක් විශාල ඉඩම වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1106/130හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මෑතකදී කරන ලද මැනීමකට අනුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාවේ, වසම් අංක 19, කොච්චිකඩේ දකුණ, අළුත් යෝන් වීදිය තුළ පිහිටි අළුත් යෝන් වීදියේ දැනට වරිපනම් අංක 158 දරන ඉඩමට බලයලත් මානක එස්. රාසප්පා විසින් 2007.09.22 දින පිළියෙල කරන ලද අංක 497/2007 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ නමැති ඉඩම් කොටස වන උතුරට : අළුත් යෝන් වීදියෙන් ද, නැගෙනහිරට : අළුත් යෝන් වීදියේ වරිපනම් අංක 160 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : පරණ යෝන් වීදියේ, වරිපනම් අංක 156 දරන පරිශ්‍රයෙන් ද, සහ බටහිරට : අළුත් යෝන් වීදියේ වරිපනම් අක 156 දරන පරිශ්‍රයෙන් ද මායිම් වූ එකී අංක 497/2007 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතයි දශම තුනයි බිංදුව (අ. 0. රූ. 0, පර්. 7.30)ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-1013/8

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මොහොමඩ් අෂ්රාෂ් මොහොමඩ් රිෆාස්.

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.02.23 දින සහ අංක 2699 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් අෂ්රාෂ් මොහොමඩ් රිෆාස් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකසිය තිස්හතරලක්ෂ අනූතුන්දහස් අනූතුනයි ශත අනූහතර (රු. 13,493,093.94) ක මුදලක් 2010.02.23 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,493,093.94ක මුදලට 2010.02.24 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2699 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාවේ, කඳාන උප කාර්යාල තුළ, නාගොඩ කඳාන පිහිටි සෙලින්කෝ නිවාස පාරේ, වරිපනම් අංක 36 දරන පුංචිආනියාකන්ද නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් පිළියෙල කරන ලද 2003.06.20 දිනැති අංක 2244 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (ලොට් 96) සහ අඩි 30 පළල (ලොට් 75) පාරෙන් ද, නැගෙනහිරට : අඩි 30 පළල පාර (ලොට් 75) සහ ලොට් 74න් ද, දකුණට : ඩබ්. එස්. ඊ. එල්. පෙරේරා, කේ. ජී. ජෝසප් සහ තවත් අයට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් එෆ් සහ එච් වලින් ද, මායිම් වූ එකී අංක 2244 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිදෙක (අ. 0, රූ. 0, පර්. 22)ක් විශාල ඉඩම වේ.

ඉහත කී අංක 2699 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-1013/9

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හෝමාගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඉන්දික ප්‍රභාත් මහානාම.

2010.07.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ බෝමිරිය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 15 දිනැති අංක 21/1999 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඉඩම් කට්ටිය නමැති ඉඩමේ ලොට් 6 ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) (බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 1964.12.18 දිනැති අංක 166 දරන සැලැස්මේ සඳහන් ලොට් 1හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ 4 ද, නැගෙනහිරට : ලොට් 1, 4 සහ ලොට් 5 ද, දකුණට : ලොට් 3 සහ 2 සහ බස්නාහිරට : ලොට් 3 සහ 2 සහ පාර ද යන මායිම් තුළ එකී අංක 21/1999 දරන සැලැස්ම අනුව පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්. 9) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 1268/153 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-1014/3

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/09/00461/ජීඑ1/263.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩබ්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2003.08.02 දින හා අංක 17971 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කෝට්ටේගොඩ පදිංචි තනුජා සමන්ති වික්‍රමරත්න සහ නුරාජන් නම්බුකාර පල්ලියගුරු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.05.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එකොලොස් ලක්ෂ පනස් නවදහස් තුන්සිය අනූපහයි ශත පනස් අටක (රු. 11,59,395.58) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 17971 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් පන්සිය දහසයයි ශත දාහත (රු. 516.17) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දික්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ බෙලිවත්ත පිහිටි, මේදාගේ අම්මගේවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් සකසන ලද 1980.04.04 දිනැති හා අංක 1670 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 37.2ක් බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 578/154 යටතේ ලියාපදිංචි කර ඇත.

අයි. විමලසේන,
සාමාන්‍යාධිකාරී.

2010 සැප්තැම්බර් මස 02 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

09-868/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මාලඹේ ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.04.06 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0670-3012563-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. කේ. විජේරත්න විසින් සහතික කරන ලද 2006 අගෝස්තු මස 08 දිනැති අංක 947 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කඩුවෙල පදිංචි සමන්ත රුවන් හෙට්ටිආරච්චි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හතලිස් තුන්දහස් නවසිය අසූදෙකයි ශත පනස් නවයක (රු. 3,43,982.59) මුදලක් 2009 මාර්තු මස 27 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 3,43,982.59 මුදලද, 2009 මාර්තු මස 28 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 947 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, (හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හේවාගම පිහිටි බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 4 වැනි අංක 4293 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මොරගහලන්ද නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : චන්ද්‍රපාල, තිලකසිරි පෙරේරාගේ ඉඩම සහ බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර විසින් සාදන ලද 2002 මාර්තු මස 17 දිනැති අංක 3397 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : එකී අංක 3397 දරන සැලැස්මේ සඳහන් ලොට් 1, කැකිරිදෙනිය පාර සහ තිලකසිරි පෙරේරා ඉඩම ද, දකුණට : බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර විසින් සාදන ලද 2001 මාර්තු මස 30 වැනි දිනැති අංක 3082 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ලකුණු කළ අඩි 10ක් පළල පාර සහ බස්නාහිරට : එස්. එස්. හෙට්ටිආරච්චිගේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 4293 දරන සැලැස්ම අනුව පර්චස් තිස් පහයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 35.3) විශාල ඉඩම.

ඉහත විස්තර කරන ලද එකී අංක 4293 දරන සැලැස්මේ ලොට් 1 ලකුණු කළ පෙර කී ඉඩම් කොටස පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසක් වේ.

පෙර කී හේවාගම පිහිටි බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර විසින් සාදන ලද 2001 මාර්තු මස 30 වැනි දිනැති අංක 3082 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මොරගහලන්ද නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : චන්ද්‍රපාල සහ තිලකසිරි පෙරේරාගේ ඉඩම් සහ බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් සාදන ලද 2000 අගෝස්තු මස 16 දිනැති අංක 1655 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : තිලකසිරි පෙරේරාගේ ඉඩම සහ බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් සාදන ලද 2000 අගෝස්තු මස 16 වැනි දිනැති අංක 1655 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 සහ කැකිරියදෙණිය පාර ද, දකුණට : එකී අංක 3082 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ලකුණු කළ අඩි 10ක් පළල පාර ද සහ බස්නාහිරට : එස්. එස්. හෙට්ටිආරච්චිගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 3082 දරන සැලැස්ම අනුව පර්චස් තිස් නවයයි දශම තුනක් (අ. 0, රූ. 0. පර්. 39.3) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 1359/138 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ගය සඳහා වෙන් කිරීම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සහ සියලු වෙනත් අයිතීන් සමග.

පෙර කී හේවාගම පිහිටි මොරගහලන්ද නමැති ඉඩමේ පෙර කී අංක 3082 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 2 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු පී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1987.02.12 දිනැති අංක 5410 දරන සැලැස්මේ සඳහන් ලොට් බී2 හි කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : කැකිරිදෙණිය පාර ද, දකුණට : පී. ඩබ්ලිව්. පියසේනගේ ඉඩම සහ බස්නාහිරට : එස්. එස්. හෙට්ටිආරච්චිගේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 3082 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 1359/139 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-1014/2

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

හොන්නන්තර ආචාරිගේ දොන් කුමුදු ප්‍රියන්ත.
ණය ගිණුම් අංක : 477679.

2009 ජුලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එම්. රණසිංහ විසින් 2008 ඔක්තෝබර් මස 21 වැනි දින සහතික කරන ලද අංක 795 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හොන්නන්තර ආචාරිගේ දොන් කුමුදු ප්‍රියන්ත ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන තුනක් සහ තුන්ලක්ෂ හැත්තෑ දෙදහස් හයසිය විසි දෙකයි ශත දෙකක (රු. 33,72,622.02) මුදලක් 2009 ජුනි මස 08 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන් තුනක් සහ තුන්ලක්ෂ හැත්තෑ දෙදහස් හයසිය විසි දෙකයි ශත දෙකක මුදල (රු. 33,72,622.02) අයකර ගැනීම සඳහා 2009 ජුනි මස 09 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 30,00,000ක මුදල මත 19%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරණ ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 795 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ, අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් 2002 මැයි මස 8 වැනි දින සාදන ලද පිඹුරු අංක 1328හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු තලංගම උඩවත්ත පාරේ පිහිටි දෙල්ගහවත්ත සහ ගලබොඩවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 5 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 6 කොටස ද, නැගෙනහිරට : ලොට් 13 සහ 14 යන කොටස් ද, දකුණට : එම ඉඩමේම ලොට් ඊ කොටස ද, (ඩී. එස්. ජයසිංහ සහ අනෙකුත් අයගේ ඉඩම) බස්නාහිරට : ලොට් 4 යන ඉඩම් කැබලි ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 1328 ට අනුව පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) හෝ හෙක්ටයාර් 0.02023ක් විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී1819/181 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද බලයලත් මිනන්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් 1981 ජූලි මස 07 වැනි දින සාදන ලද පිඹුරු අංක 1368හි දැක්වෙන ලොට් 21සහ ලොට් 13 ද, පිඹුරු අංක 2278හි දැක්වෙන ලොට් 2ට් ද යන බිම් කොටස් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග යි.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

09-990

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක P. Q. 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

නවරත්න මුදියන්සේලාගේ සුභාෂිණී මැණික් බංඩාර.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක පී. කිව්. 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 ජූලි මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජේපාල දීගොඩ ගමගේ විසින් ලියා සහතික කරන ලද මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන අංක 4378 සහ 2006 මාර්තු මස 03 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන වත්තල, හැඳල කෙරවලපිටිය අංක 410 දරන ස්ථානයේ පදිංචි නවරත්න මුදියන්සේලාගේ සුභාෂිණී මැණික් බංඩාර යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින්න (කලින් කොළඹ 01, යෝක් වීදියේ, අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2009.06.15 වැනි දිනට රුපියල් හයලක්ෂ දාහතරදහස් දෙසිය අසූදෙකකුත් ශත හැත්තෑඑකක (රු. 6,14,282.71) මුදලක් වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින් බැවින් ද,

ඉහත කී රුපියල් හයලක්ෂ දාහතර දහස් දෙසිය අසූදෙකකුත් ශත හැත්තෑඑකක (රුපියල් 6,14,282.17) මුදල සහ 2009.06.15 වැනි දිනට නිවාස ණය මත හිඟ මුදල් වන රුපියල් පන්ලක්ෂ හැටහත්දහස් අටසිය දහඅටකුත් ශත හැත්තෑ අටක (රු. 5,67,818.78) මුදල මත 2009.06.16 වැනි දිනට සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයට 21.88% බැගින් තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්හි එම්. ඩබ්ලිව්.

ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාලයේ කෙරවලපිටිය කෙරවලපිටිය ගමෙහි පිහිටි ජම්බරේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3119B සහ 2005 පෙබරවාරි මස 24 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල ලොට් A1 දරන බිම් කොටසට මායිම් උතුරට : ඇල ද, නැගෙනහිරට : වර්තමානයේ එම්. ඩී. ජී. එම්. මාග්‍රට් යන අයට අයිති අංක 281/1989 දරන පිඹුරේ ලොට් B ද, දකුණට : අඩි 20ක් පළල පාර ද, බස්නාහිරට : කෙරවලපිටිය පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3119B දරන පිඹුර අනුව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත සඳහන් ලොට් A1 වනාහි බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 282 සහ 1989 අගෝස්තු මස 17 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් A දරන බිම් කැබැල්ලේ නැවත බෙදා වෙන් කිරීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

09-1034

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

බස්නායක ලී වෙළඳසැල.
ගිණුම් අංක : 0031 1000 3861.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ අගෝස්තු මස 04 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2006 මාර්තු මස 10 දාතම හා අංක 3752 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලංසූරිය යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මැයි මස 22 දාතම හා අංක 717 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "බස්නායක ලී වෙළඳසැල" යන ව්‍යාවාරික නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන සුනිල් බස්නායක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් තුන්ලක්ෂ අසූ දෙදහස් තුන්සිය හතයි ශත විසි දෙකක (රු. 43,82,307.22) මුදලක් 2010 ජූලි මස 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් තුන්ලක්ෂ අසූ දෙදහස් තුන්සිය හතයි ශත විසි දෙකක (රු. 43,82,307.22) මුදල ද 2010 ජූලි මස 06 දින සිට අංක 3752 සහ 717 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිහය ලක්ෂ තුන්දහස් හාරසියයක (රු. 26,03,400) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයක (9%) හා තවත් රුපියල් පහළොස් ලක්ෂයක (රු. 15,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3752 සහ 717 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ මොරටුවැල්ල ග්‍රාමයේ නව ගාලු පාරේ පිහිටි වරිපනම් අංක 370 දරන "දොඹගහවත්ත, ගොරකානවලකඩ, මදනගහවත්ත කිරිපැල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එස්. සී. විතානගේ යන අය විසින් සාදන ලද 2006 පෙබරවාරි මස 01 දාතම හා අංක 835 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර ද, නැගෙනහිරට : නව ගාලු පාර, දකුණට : අංක 3552 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : දුම්රිය මාර්ගය සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතයි එකක් (අ. 0, රූ. 0, පර්. 7.71) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 835 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M2551/261 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-1047/7

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

නාඔටුන්න ඔටෝ ඇන්ඩ් පවර් ඉන්ජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0035 1000 5073.

සීමාසහිත සම්පත් බැංකුව හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ අගෝස්තු මස 04 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ යන අය විසින් ලියා සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 18 දාතම හා අංක 1099 දරන හා ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. එන්. ද සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු මස 27 දාතම හා අංක 97 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් නීතිය යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන, නාඔටුන්න ඔටෝ ඇන්ඩ් පවර් ඉන්ජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායීන් වශයෙන් හා වේමන්ත අරිප්‍රිය නාඔටුන්න උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිනම ලක්ෂ හැටතුන් දහස් පන්සිය හයයි ශත විසිපහක (රු. 29,63,506.25) මුදලක් 2010 ජුනි මස 09 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිනම ලක්ෂ හැටතුන් දහස් පන්සිය හයයි ශත විසිපහක (රු. 29,63,506.25) මුදල ද 2010 ජුනි මස 10 දින සිට අංක 1099 සහ 97 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිතුන් ලක්ෂ අසූතුන් දහස් හයසිය අසූවක (රු. 22,83,680) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් තුන්ලක්ෂ විසිහතර දහස් හයසිය පනහක (රු. 3,24,650) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1099 සහ 97 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල ග්‍රැවට් හතර තුළ කිතුලම්පිටිය ග්‍රාමයේ පිහිටි කහදූව නාවින්න පාර වරිපනම් අංක 51A/2 දරන "කැන්දගහවිට නොහොත් මහකැන්දගහවිට, පුංචි කැනදගහවිට, දොඹගහවිට නොහොත් පුංචිදොඹගහවිට හී ලොට් 1" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එන්. ඩබ්ලිව්. ලියනගේ යන අය විසින් සාදන ලද 2005 අප්‍රේල් මස 30 දාතම හා අංක 3582 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් E වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බෙල්ඕවිට, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් $1A^2$ සහ ලොට් 1B සහ බටුවන්තුඩාව දක්වා මහ පාර සහ එම ඉඩමේම ලොට් 1C සහ ලොට් D, දකුණට : එම ඉඩමේ ලොට් 3 සහ බස්නාහිරට : කැබැල්ලගහවිට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහයි දශම තුනක් (අ. 0, රූ. 1, පර්. 12.3) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතායන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3582 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A595/259 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-1047/8

---

**මහජන බැංකුව - කඩුවෙල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වන වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වැනි වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද 2006.03.09 දිනැති අංක 214 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මණ්ඩාවල කංකානමගේ ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා, මල්දෙණිය කංකානමලාගේ චමරි මල්දෙණිය මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හත්ලක්ෂ හැටහතරදහස් අටසිය හැත්තෑවයි ශත හැටඑකක් (රු. 7,64,870.61) මුදලක් මහජන බැංකුවට අයවිමට ඇති බැවින් ද, 2009.01.15 දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම හතයි පහ බැගින් (16.75%) වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත්ලක්ෂ හැටහතරදහස් අටසිය හැත්තෑවයි ශත හැටඑකක් (රු. 7,64,870.61) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් එකී අංක 214 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ හෝකන්දර උතුර (දැනට නැගෙනහිර) යන ගම පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත්

මිනින්දෝරු ප්‍රියන්ත පුංචිහේවා මහතා විසින් 2001.11.10 දින මැන සාදන ලද අංක 1123 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 1 දරන ඉඩමට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර සහ කැබලි අංක 2 ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 2 සහ අංක 1222 දරන පිඹුරේ කැබලි අංක 2 ද, බස්නාහිරට : අංක 1222 දරන පිඹුරේ අංක 03 සහ පාර ද යන මෙකී මායිම් තුළ වූ රූඩ් එකයි පර්චස් එකොළහයි දශම පහයි බිංදුවක් (අ 0, රූ. 1, පර්. 11.50)ක් විශාල ඉඩම වේ.

මෙම උකස්කරය අංක G1353/182 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත) මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

09-916

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මත පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මත ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 4272 හා 2007 අප්‍රේල් මස 11 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් කුරුණෑගල පොත්නවිල විදානලාගේ දෝන ශ්‍රියා කාන්ති යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 අප්‍රේල් මස 30 වැනි දිනට ඉහත කී අංක 4272 දරන උකස් බැඳුම්කරය මත එකී පොත්නවිල විදානලාගේ දෝන ශ්‍රියා කාන්ති යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස් දෙලක්ෂ අසූහතර දහස් හයසිය හැට අටකුත් ශත හතලිස් හතරක (රු. 32,84,668.44) මුදලක් සහ 2010 මැයි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිහතර ලක්ෂ තිස්පන් දහස් නවසිය පනස් දෙකකුත් ශත දහයක් (රු. 24,35,952.10) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ ඩබ්ලි. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස් දෙලක්ෂ අසූහතර දහස් හයසිය හැට අටකුත් ශත හතලිස් හතරක (රු. 32,84,668.44) මුදලක් සහ 2010 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිහතර ලක්ෂ තිස්පන් දහස් නවසිය පනස් දෙකකුත් ශත දහයක් (රු. 24,35,952.10) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් දේ සහ මාර්ග අයිතිය ද සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව අයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු සමග ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 4272 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුවට උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය එහි ගොඩනැගිලි හා වෙනත් දේ සහ මාර්ග අයිතිය සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 4272 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා සීමාව ඇතුළත, පුත්තලම් පාර, වරිපනම් අංක 258 දරන කඳුබොඩහේන දැනට වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර මැන සකස් කළ අංක 42/89 හා 1989 මාර්තු  දින දරන පිඹුරේ ලොට් "H" ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට එකී පිඹුරු ප්‍රකාර මායිම්, උතුරු-නැගෙනහිරට : පාර ද, දකුණු-නැගෙනහිරට : ඩැනියෙල්ස් මහතාගේ දේපළ ද, දකුණු-බස්නාහිරට : එකී අංක 42/89 පිඹුරේ ලොට් අංක A, G, J හා I ද, උතුරු-බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ජී. ඒ. ද සිල්වා මැන සකස් කළ අංක 2265 දරන පිඹුරේ ලොට් අංක 01 ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකක් (අ. 1, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ හා ඉහත සඳහන් අංක 42/89 දරන පිඹුරේ ලොට් J ලෙස ලකුණු කළ අඩි 20ක් පළල පාර පොදුවේ පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිවාසිකම ද වේ.

මෑතක දී කරන ලද මැනීමකට අනුව ඉහත කී කුරුණෑගල පුත්තලම් පාර, වරිපනම් අංක 258 දරන "කඳුබොඩහේන දැනට වත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. කේ. පෙරේරා මැන සකස් කළ අංක 1250B සහ 2007.04.10 දින දරන පිඹුරේ "ලොට් A" ලෙස ලකුණු කළ ඉඩමට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරු-නැගෙනහිරට : එලුගල ගල ද, දකුණු-නැගෙනහිරට : ඩැනියෙල්ස් මහතාගේ දේපළ ද, දකුණු-බස්නාහිරට : අංක 42/89 දරන පිඹුරේ ලොට් A පුත්තලම් පාර වරිපනම් අංක 258 දරන පරිශ්‍රය, අංක 42/89 දරන පිඹුරේ ලොට් පුත්තලම් පාර වරිපනම් අංක 258/A දරන පරිශ්‍රය ද, පුත්තලම් පාර සිට අඩි 20 පළල සහ අංක 42/89 දරන පිඹුරේ ලොට් 01 පුත්තලම් පාර වරිපනම් අංක 258/A

දරන පරිශ්‍රය ද, උතුරු-බස්නාහිරට : අංක 2265 දරන පිඹුරේ ලොට් අංක 01 දැනට මාරඹේ මහතාට අයිති දේපළ යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකක් (අ. 1, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

09-895

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.12.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2007.10.31 දිනැති අංක 726 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.02.12 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් එකොලොස් ලක්ෂ විසිහය දහස් එකසිය අනූපහයි ශත හතලිස් තුනක (රු. 11,26,195.43) මුදලක් සමග රුපියල් අටලක්ෂ දාසය දහස් හයසිය තිහක (රු. 8,16,630) මුදලක් මත වසරකට සියයට තිස්එක (31%) බැගින් පොලියක් ද, 2010.02.13 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පන්නිපිටිය, නියැඳගල අංක 57/2 හි පදිංචි ආරච්චිගේ දොන් සරත් ඒකනායක මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 726 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් එකොලොස් ලක්ෂ විසිහය දහස් එකසිය අනූපහයි ශත හතලිස්තුනක (රු. 11,26,195.43) මුදල සමග 2010.02.13 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290හි පදිංචි වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ නියැඳගල පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුලු සියළු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු පී. වැලිකල විසින් 2006 නොවැම්බර් මස 11 වැනි දින සාදන ලද අංක 769A දරන පිඹුරේ ලොට් A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්. එකී ලොට් A උතුරට : සරත් ප්‍රේමතිලක හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : පිට ඇල ද, දකුණට : ලොට් B ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු පී, කේ. සුමනදාස විසින් සාදන ලද 1986 ඔක්තෝබර් මස 16 වැනි දිනැති අංක 76/1483 දරන පිඹුරේ ලොට් 6 ද මායිම්ව එකී පිඹුරු අංක 769A ප්‍රකාර පර්චස් දොලහයි දශම බිංදුවයි හතක (අ. 0, රූ. 0, පර්. 12.07) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1692/12හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
වැල්ලවත්ත.

09-1025

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - ලෝක වෙළඳ මධ්‍යස්ථානය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : අවුට්ඩෝර්ස්මන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, අවුට්ඩෝර්ස්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් ද ශ්‍රී රාජ් හමීඩ් උකස්කරු වශයෙන් ද කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 1369 සහ 2003.09.01 සහ සියල්ලම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් ලියා සහිත කරන ලද අංක 1261 සහ 2004.01.22, අංක 1537 සහ 2005.01.13 සහ අංක 2604 සහ 2008.03.13 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2010.06.15 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දාහත් ලක්ෂ අනූ එක් දහස් හත්සිය හැටපහයි ශත හතලිස් අට (රු. 17,91,765.48) ක මුදල සහ 2010.06.01 වැන දින සිට රුපියල් ලක්ෂ දහය (රු. 10,00,000) මුදල මත වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් පොළිය ද රුපියල් ලක්ෂ දහය (රු. 10,00,000) ඉක්මවන මුදල මත වර්ෂයට සියයට විසි නමය (29%) බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 1369, 1261, 1537 සහ 2604 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දාහත් ලක්ෂ අනූ එක් දහස් හත්සිය හැටපහයි ශත හතලිස් අට (රු. 17,91,765.48) ක මුදල ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවෙහි අතුරුගිරිය උප කාර්යාල සීමාව තුළ හෝකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් මැන සාදන ලද අංක 2778 සහ 1988.06.29 දිනැති සැලැස්මෙහි ලොට් අංක 3හි යලි මැනුමක් වන) හෝකන්දර පාර වරිපනම් අංක 435/8 දරන දාඹුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 3264 සහ 1999.10.02 දරන සැලැස්මෙන් ලොට් ඒ වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : හෝකන්දර පාරේ අංක 435/9 දරන පරිශ්‍රය, ඩයස්ට අයත් ඉඩම, හෝකන්දර පාරේ වරිපනම් අංක 435/14 දරන පරිශ්‍රය සහ විමලාවතී සුදසිංහට අයත් ඉඩම, නැගෙනහිරට : හෝකන්දර පාර වරිපනම් අංක 435/1සී, දකුණට : පාර සහ බස්නාහිරට : හෝකන්දර පාර වරිපනම් අංක 507/3 යන මායිම් තුළ පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 00)ක් විශාල ඉඩම. හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1241/247 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වල විසින් මැන සාදන ලද අංක 3264 සහ 1999 ඔක්තෝබර් මස 02 දිනැති සැලැස්මේ දැක්වෙන මාර්ග අයිතිය ද සමගින්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

09-1028/7

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පරණ යොන් වීදිය

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : එම්. එස්. ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, එම්. එස්. ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී, කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. කනේෂගයෝගන් විසින් ලියා සහතික කරන ලද අංක 1309 සහ 2006.10.12 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 1309 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් (i) 2010.04.18 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් විසි දෙලක්ෂ පනස් එක් දහස් දෙසීය විසි පහයි ශත හැත්තෑවක (රු. 22,51,225.70) ක මුදල සහ 2010.04.01 වැනි දින සිට රුපියල් විසි ලක්ෂය (රු. 20,00,000) මුදල මත වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් පොළිය ද රුපියල් විසි ලක්ෂය (රු. 20,00,000) මුදල ඉක්ම වූ මුදල සඳහා වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් පොළිය ද සහ (ii) 2010.04.18 වැනි දින දක්වා මුල් මුල පොළිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ දාහතර දහස් හත්සිය අසූ අටයි ශත හැට හතක මුදල (රු. 3,14,788.67) සහ 2010.04.19 වැනි දින සිට රුපියල් දෙලක්ෂ පනස් දහස් දෙසීය දහය (රු. 2,50,210) ක මුදල මත වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් පොළිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 1309 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් විසිපන් ලක්ෂ හැට හයදහස් දාහතරයි ශත තිස් හත (රු. 25,66,014.37) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මොන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු ශ්‍රියාණි මනම්පේරි වෙත එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ. දෙහිවල ගල්කිස්ස නගර සභා සීමාව තුළ ගල්කිස්ස කොට්ඨාසය අංක 18 පිහිටි ගල්කිස්ස දුම්රිය පල පාර වරිපනම් අංක 32/3 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ක්‍රිෂානමූර්ති විසින් මැන සාදන ලද අංක 2006/413 සහ 2006.06.01 දරන සැලැස්මේ නිරූපිත ලොට් ඒ දරන බිම් කැබැල්ල (බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 4049 සහ 1964.10.15 දරන සැලැස්මේ නිරූපිත ලොට් ඒ, බී, සී හි කොටසක නැවත මැනීමක් සහ බලයලත් මිනින්දෝරු එස්. අබේරත්න විසින් මැන සාදන ලද අංක 154 සහ 1992.09.20 දරන සැලැස්මේ නිරූපිත ලොට් 1 හි අනන්‍යය කොටසකි), උතුරට : ශ්‍රී රාජපුෂ්පාරාමය විහාර බිම ද, නැගෙනහිරට : ශ්‍රී රාජපුෂ්පාරාමය පාර, දකුණට : දුම්රියපළ පාර, වරිපනම් අංක 32/2 දරන ගොඩනැගිල්ල සහ බස්නාහිරට : ලිලියන් ඇවනිව් හි අංක 10/6 දරන ගොඩනැගිල්ලද මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි තුන (අ. 0. රූ. 0, පර්. 10.53)ක් විශාල ඉඩම සහ ඉහත කී 2006/413 දරන සැලැස්ම ප්‍රකාරව එහි ඇති ගහකොළ, පළතුරු, වැවිලි සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇති සියල්ලම වේ. වර්තමානයේ දෙල්කඳ නුගේගොඩ පිහිටා ඇති ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2976/50 දරන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් ඒ පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ ගල්කිස්ස කොට්ඨාසය අංක 18 පිහිටි ගල්කිස්ස දුම්රිය පළ පාර වරිපනම් අංක 32/3 පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අබේරත්න විසින් මැන සාදන ලද අංක 154 සහ 1992.09.20 වැනි දරන සැලැස්මේ නිරූපිත ලොට් 1 (බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 4049 සහ 1964.10.15 වැනි දරන සැලැස්මේ නිරූපිත ලොට් ඒ. එබී, සී1හි අනු බෙදුමක් වේ) වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්නය කර ඇති උතුරට : ශ්‍රී රාජපුෂ්පාරාමය විහාර බිම ද, නැගෙනහිරට : ශ්‍රී රාජපුෂ්පරාමය පාර, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : ලිලියන් ඇවනිව් හි අංක 10/6 දරන ගොඩනැගිල්ලද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම තුනයි අටයි (අ. 0, රූ. 0, පර්. 11.38)ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සුදත් නැලිගම,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

09-1028/6

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ලංකා ක්වලටි මාර්කටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, ලංකා ක්වලටි මාර්කටිං සර්විසස් බන්ධනදායියා වශයෙන් ද, (බන්ධනදායියාගේ අධ්‍යක්ෂකවරයෙක් වන) දේවමුල්ලගේ නිශාන්ත රාජිත පෙරේරා උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 1289 සහ 2007.06.05 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.06.01 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑ පන්දහස් තුන්සිය අනූ හතරයි ශත හතලිස් හතර (රු. 33,75,394.44) ක මුදල සහ 2009.06.01 වැනි දින සිට රුපියල් තිස් දෙලක්ෂ අසූ අටදහස් දෙසීය අනූවයි ශත තිස් හත (රු. 32,88,290.37) මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොළිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 1289 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑ පන්දහස් තුන්සිය අනූ හතරයි ශත හතලිස් හතර (රු. 33,75,394.44) ක මුදල 2009.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී, කේ. ඊ. සේනාපති වෙත එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේහි මහරගම නගර සභා සීමාව තුළ තලවතුගොඩ පිහිටි බොරැල්ල පාරේ වරිපනම් අංක 518/6ඒ දරන කෝන්ගහලන්දේ වත්ත නොහොත් කොස්ගහලන්දේවත්ත නමැති (බලයලත් මිනින්දෝරු එස්. ගුණතිලක විසින් මැන සාදන ලද අංක 2385සී සහ 2003.02.11 දිනැති සැලැස්මෙහි ලොට් 2ඒ දරන කැබැල්ල යළි මැන බෙදා වෙන් කරන ලද) ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් මැන සාදන ලද අංක 4783 සහ 2006 දෙසැම්බර් මස 10 දිනැති සැලැස්මේ ලොට් 1 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ඇති උතුරට : පුද්ගලික පාර, නැගෙනහිරට : අංක 2385සී සැලැස්මේ ලොට් 2බී, දකුණට : අඩි 12ක් පළල පාර ( අංක 2385සී සැලැස්මේ ලොට් 2සී) සහ බස්නාහිරට : අංක 4783 සැලැස්මෙහි ලොට් 2 යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම. හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1701/94 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එච්. කේ. මහීන් විසින් මැන සාදන ලද අංක 1549 සහ 2002.10.24 දිනැති සැලැස්මේ දැක්වෙන ලොට් 2සී මත මාර්ග අයිතිය ද අනෙකුත් අයිතීන් ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

09-1028/9

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ගාල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : මොහමඩ් සිද්දික් මොහමඩ් මුනාෆර් සහ අබ්දුල් හකීම් ෆාතුමා නස්ලියා හෙවත් අබ්දුල් හකීම් සිත්ති නස්ලියා.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, මාහමඩ් සිද්දික් මොහමඩ් මුනාෆර් සහ අබ්දුල් හකීම් ෆාතුමා නස්ලියා හෙවත් අබ්දුල් හකීම් සිත්ති නස්ලියා බන්ධනදායියන් වශයෙන් ද අබ්දුල් හකීම් ෆාතුමා නස්ලියා හෙවත් අබ්දුල් හකීම් සිත්ති නස්ලියා උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් මන්සූර් මරික්කාර් විසින් ලියා සහතික කරන ලද අංක 10794 සහ 2008.06.20 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2010.02.19 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දහතුන් ලක්ෂ හැට හත් දහස් හයසිය අටයි ශත තිස් තුනයි (රු. 13,67,608.33) ක මුදල සහ 2010.02.01 වැනි දින සිට රුපියල් දොලොස් ලක්ෂයක (රු. 12,00,000) මුදල මත වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් පොලිය ද රුපියල් දොළොස් ලක්ෂය (රු. 12,00,000) ඉක්මවන මුදල මත වර්ෂයට සියයට විසි නමය (29%) බැගින් පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 10794 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දහතුන් ලක්ෂ හැට හත් දහස් හයසිය අටයි ශත තිස් තුනයි (රු. 13,67,608.33) ක මුදල ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### ඉහත සඳහන් උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගින්තොට පිහිටි ''වැලිවත්ත'' ඉඩමෙහි බෙදා වෙන් කරන ලද ඉතිරි කොටස නොහොත් වැලිවත්ත ඉඩමෙහි ලොට් 3, 4 සහ 5හි ලොට් 2හි ලොට් 2බී හි ලොට් 2බී1 සහ 2බී2 යන එකිනෙකට යාබදව පිහිටි ඒකාබද්ධ කරන ලද ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එච්. එස්. විතානාච්චි විසින් මැන සාදන ලද අංක 1153 සහ 2007 නොවැම්බර් මස 10 දිනැති සැලැස්මේ ලොට් සී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්නය කර ඇති උතුරට : ලොට් 2බී3 සහ 2බී6, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 3, දකුණට : ලොට් ඩී සහ ඊ සහ බස්නාහිරට : ලොට් 1ඩී3, ඩී2බී සහ 2බී5 යන මායිම් තුළ පිහිටි පර්චස් විසි තුනක් (අ. 0, රූ. 0, පර්. 23)ක් විශාල ඉඩම.

2. ඉහත කී ගින්තොට පිහිටි වැලිවත්ත ඉඩමෙහි බෙදා වෙන් කරන ලද ඉතිරි කොටස නොහොත් වැලිවත්ත ඉඩමෙහි ලොට් 3, 4 සහ 5 හි ලොට් 2හි ලොට් 2බී හි ලොට් 2බී1 සහ 2බී2 යන එකිනෙකට යාබදව පිහිටි ඒකාබද්ධ කරන ලද ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එච්. එස්. විතානච්චි විසින් මැන සාදන ලද අංක 1153 සහ 2007 නොවැම්බර් මස 10 දිනැති සැලැස්මේ ලොට් ඩී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්නය කර ඇති උතුරට : මෙම ඉඩමෙහි ලොට් සී, නැගෙනහිරට : මෙම ඉඩමෙහිම ලොට් 3, දකුණට : මෙම ඉඩමෙහිම ලොට් 2ඒ සහ ලොට් 2 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් ඊ (පාර) යන මායිම් තුළ පිහිටි පර්චස් නමයයි දශම හත (අ. 0, රූ. 0, පර්. 9.7)ක් විශාල ඉඩම.

අංක 1153 දරන සැලැස්මේ ලොට් ඊ මත මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

09-1028/8

---

### මහජන බැංකුව - ධර්මපාල මාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ ''29ඩී'' වැනි වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රුබසිංහ විසින් සහතික කරන ලද 2008.07.14 වැනි දිනැති අංක 4778 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් රසාර විරජිත් තුඩුවේවත්ත, ගයනි ෂම්ලා කෝදාගොඩ සහ ලලිතා මාගට් සමරජීව යන අය විසින් පැහැර හැර ඇති එකී උකස්කරය අංක 4778 යටතේ රුපියල් හත්ලක්ෂ අසූහය දහස් පන්සිය තිස් එකයි ශත තිස් හයක් (රු. 7,86,531.36) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.01.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් රුපියල් හත්ලක්ෂ අසූහය දහස් පන්සිය තිස් එකයි ශත තිස්හයක් (රු. 7,86,531.36) ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් හත්ලක්ෂ අසූහය දහස් පන්සිය තිස් එකයි ශත තිස් හයක් (රු. 7,86,531.36) ක මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 4778 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනිත් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ සහ මහ නගර සභා සීමාව තුළ ''බතුතා පාරේ'' පිහිටි වරිපනම් අංක 29බී දරන සුදු හකුරුගේ වත්ත නමැති ඉඩමට 2000.12.08 දිනැති සී. එස්. ජයවර්ධන බලයලත් මිනින්දෝරු මහතා විසින් ලියා සහතික කල අංක 7536 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද 3බී දරන කැබැල්ලට එකී පිඹුරු ප්‍රකාර මායිම්, උතුරට : අංක 3913 දරන පිඹුරේ සඳහන් 3ඒ දරන කැබැල්ල ද, නැගෙනහිරට : බතුතා පාර ද, දකුණට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කැබලි ද යන මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම නවයක් (අ. 0. රූ. 0, පර්. 4.9) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දෙය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 429/236හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
මාතර.

09-917

---

## මහජන බැංකුව - කන්තලේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.22 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් ජනත් ජයවර්ධන මහතා විසින් මහජන බැංකුව නමට ලියා සහතික කරන ලද 2008.12.30 වැනි දිනැති අංක 3284 දරන උකස්කරය ප්‍රකාර අයවිය යුතු ගෙවීම්, රුහුණු ෆාමින් විලේජ් පුද්ගලික සමාගම හි මාජුවානා ගමගේ ජයන්ත කාරියවසම් (සභාපති) සහ නිමාලි චන්ද්‍රසේන (අධ්‍යක්ෂ) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද එකී උකස්කරය යටතේ රුපියල් හැත්තෑ පන් ලක්ෂයක (රු. 75,00,000)ක මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද එකී රුපියල් හැත්තෑපන් ලක්ෂය (රු. 75,00,000) ක මුදල මත 2009.01.20 දින සිට වෙන්දේසි දිනය දක්වා අවුරුද්දට සියයට විසිහතර (24%) බැගින් තවදුරටත් පොළිය හා ආදළ මහජන බැංකු පනත 29එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග ඉන් අනතුරුව යම්කිසි ගෙවීම් කිසිවක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හැත්තෑ පන්ලක්ෂය (රු. 75,00,000) ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකාර මහතා විසින් එකී අංක 3284 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ මෙයින් තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ. හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුව, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, හබරකඩ ග්‍රාමයේ පිහිටා තිබෙන, හබරකඩවත්ත *හෙවත්* දඹකන්දේවත්ත *හෙවත්* කදිරකන්දේවත්ත යනුවෙන් ද කදිරකන්දේ කුඹුර හෙවත් දඹකන්ද යනුවෙන් හැඳින්වෙන ඉඩමට ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම බලයලත් මිනින්දෝරු මහතා විසින් 2008.02.03 වැනි දින මැන සකස් කරන ලද අංක 306 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1ඒ හි නව මිනුමක් වන එක්ස් වශයෙන් හඳුන්වනු ලබන අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් නවයයි දශම දෙකයි බින්දුව (අ. 1, රූ. 2, පර්. 9.20)ක් (හෙක්ටයාර් 0.63030) විශාල ඉඩමට ඉහත කී අංක 306 දරන පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට : ඇළ, නැගෙනහිරට : ශ්‍රී ලංකා යුද හමුදාවට අයත් ඉඩමේ මායිම් වන ඇල, දකුණට : ඇළ සහ බස්නාහිරට : ශ්‍රී බෝධිරාජ මාවත යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු ආදී සියලු දේත් වේ.

මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 2008.12.31 වැනි දින G 1774/84හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ත්‍රිකුණාමලය.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ත්‍රිකුණාමලය.

09-914

---

## සෙලාන් බැංකුව පීඑල්සී - අවිස්සාවේල්ල ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0750-01901016-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ගුණවර්ධන විසින් දෙකම සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 519 සහ අංක 520 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම අවිස්සාවේල්ල පදිංචි සමරකෝන් මාඉටිපේ සුදත් සහ මිල්ලවිටිය මානන්නලාගේ රුක්මා මල්කාන්ති ඒකනායක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහහතරලක්ෂ තිස්අටදහස් හයසිය හැටපහයි ශත අසූඑකක (රු. 14,38,665.81) මුදලක්, 2008 නොවැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 14,38,665.81 මුදලද, 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 519 සහ 520 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්

කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මුරුතැන්ගල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. වෙලගෙදර විසින් සාදන ලද 2006.06.12 වැනි දිනැති අංක 3928 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මූනමල්ගහහේනේගලපල්ලේවත්ත කොටස හෙවත් මූනමල්ගහවත්ත නැමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 සහ අංක 1165 දරන සැලැස්මේ සඳහන් ලොට් 5හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 6 සහ අංක 1165 දරන සැලැස්මේ සඳහන් ලොට් 5හි ඉතිරි කොටස ද, දකුණට : අංක 1165 දරන සැලැස්මේ සඳහන් ලොට් 6 සහ 7 සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව වී 168/201 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, අවිස්සාවේල්ල මහ නගර සභා සීමාව තුළ උක්වත්ත පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසිංහ විසින් සාදන ලද 2001.09.15 දිනැති අංක ඩබ්ලිව්/3059 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හොනිටන් එස්ටේට් (කොටස) නමැති ගස් වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් සී ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 516 දරන සැලැස්මේ සඳහන් ලොට් 93 සහ ඇල ද, නැගෙනහිරට : අංක ඩබ්ලිව්/3059 දරන සැලැස්මේ සඳහන් ලොට් ඩී ද, දකුණට : යූ. සී. පාර (අංක 516 දරන සැලැස්මේ සඳහන් ලොට් 149) සහ බස්නාහිරට : ඩබ්ලිව්/3059 දරන සැලැස්මේ සඳහන් ලොට් බී ද යන මායිම් තුළ පර්චස් දොළහයි දශම බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව පී132/276 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-1016

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.08 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0160-00046816-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජේ. එන්. ජයලත් විසින් සහතික කරන ලද 2004 මැයි මස 20 දිනැති අංක 721 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම ගාල්ල පදිංචි ගොඩපිටිය සහබන්ධු ආරච්චිගේ ගීතිකා තුෂාර සහබන්ධු සහ කාරියවසම් හපුතන්තිරිගේ චින්තා දමයන්ති කාරියවසම් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ අසූඅටදහස් පන්සිය හැත්තෑඅටයි ශත හැටක (රු. 8,88,578.60) මුදලක්, 2008 ඔක්තෝබර් මස 22 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 8,88,578.60 මුදලද, 2008 ඔක්තෝබර් මස 23 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 721 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හියාරේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ විසින් සාදන ලද 2000 අප්‍රේල් මස 02 සහ 07 වැනි දිනැති අංක 713 දරන සැලැස්මේ නිරූපණය කරනු ලබන මිදැල්ලදොලේවත්තගොඩ ලොට් ඒ නමැති ඉඩමේ ලොට් අංක ඒ4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මිදැල්ලදොලේකුඹුර දෝලේකුඹුර සහ තුන්දොල ඇල ද, නැගෙනහිරට : මිදැල්ලේකුඹුර දොලේකුඹුර සහ තුන්දොල ඇල ද, දකුණට : මෙම ඉඩමේ ලොට් බී (ගොනාමුල්ල සහ කැටන්දොලට පාර) සහ බස්නාහිරට : ලොට් ඒ2 සහ ඒ3 යන මායිම් තුළ අක්කර තුනයි, රූඩ් එකයි, පර්චස් තිස්දෙකයි දශම හතරක් (අ. 3, රූ. 1, පර්. 32.4) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඩී 834/69හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-1015

**සෙලාන් බැංකුව පීඑල්සී - ජාඇල ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.01.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0270-747451-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඒ. එමැනුවෙල් විසින් සහතික කරන ලද 1995 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 668, ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් සහතික කරන ලද 1998 ජුනි මස 19 වැනි දිනැති අංක 1096, ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් දෙකම සහතික කරන ලද 2004 මාර්තු මස 05 දිනැති අංක 1132 සහ 2004 අප්‍රේල් මස 01 වැනි දිනැති අංක 1152 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ සීදූව, අම්බලම්මුල්ල, මීගමුව පාර අංක 842 හි ලියා පදිංචි කාර්යාලය පිහිටා ඇති අංක පීවී 11930 සිය ලියාපදිංචි අංකය ඇති එන්(පීවීඑස්) 14937 සිය ලියාපදිංචි අංකය ඇති සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති 1982 අංක 17 දරන සමාගම පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සිරිමැදුර ලෝන්ඩරීස් (ප්‍රයිවට්) ලිමිටඞ්, මින්පසු බන්ධනදායී වශයෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්එක්ලක්ෂ නවදහස් නවසියතිස්තුනයි ශත විසිහතක (රු. 41,09,933.27) මුදලක් 2009 ජුනි මස 03 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 41,09,933.27 මුදලද, 2009 ජුනි මස 04 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 668, 1096, 1132 සහ 1152 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක-සීදූව නගර සභා සීමාව තුළ අම්බලම්මුල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. තෝනිස් විසින් සාදන ලද 1981 සැප්තැම්බර් මස 13 වැනි දිනැති අංක 8119 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මීගමුව පාර වරිපනම් අංක 25/3 දරන මාදන්ගහවත්ත යනුවෙන් ද හඳුන්වනු ලබන සියඹලාගහ කටුව නමැති ඉඩමේ ලොට් 2ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 1 සහ ලොට් 3 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 2බී ද, දකුණට : එල්. කුමාරජීවගේ ඉඩම වෙන් කෙරෙන අගල ද සහ බස්නාහිරට : සියදෝරිස්ගේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 8119 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් විසිහයයි දශම තුනක් (අ. 0, රූ. 1, පර්. 26.3) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ ද සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 638/236 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-1014/1

---

**මහජන බැංකුව - කින්නියා ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ මහජන බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් රත්නසභාපති නවරත්න රාජා වරදන් මහතා විසින් මහජන බැංකුවට නමට ලියා සහතික කරන ලද 2007.06.26 වැනි දිනැති අංක 988 දරන උකස්කරය ප්‍රකාර අයවිය යුතු ගෙවීම් මොහිදීන් බාවා මොහොමඩ් හිල්මි හා මොහොමඩ් හිල්මි අකිලා ජහන් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද එකී උකස්කරය යටතේ රුපියල් හතලින් නමලක්ෂ අනූ අට දහස් හාරසිය හතලිස් හතයි ශත හැත්තෑ දෙක (රු. 49,98,447.72) ක මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද එකී රුපියල් හතලිස් නමලක්ෂ අනූඅට දහස් හාරසිය හතලිස් හතයි ශත හැත්තෑදෙක (රු. 49,98,447.72) ක මුදල මත 2009.04.29 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා අවුරුද්දට සියයට විසිනමය (29%) බැගින් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29ඵල් (29) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග ඉන් අනතුරුව යම්කිසි ගෙවීම් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හතලිස් නමලක්ෂ අනූ අටදහස් හාරසිය හතලිස් හතයි ශත හැත්තෑ දෙක (රු. 49,98,447.72) ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකාර මහතා විසින් එකී අංක 988 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා තඹලගමුව පත්තුව 1 කෝරළේ, කින්නියා නගරයේ, හිජ්රා වීදියේ, හතරවැනි පටුමගේ ඌත්තඩිකාඩු යනුවෙන් හඳුන්වන ඉඩමට කේ. සෙල්ලපිල්ලේ බලයලත් මිනින්දෝරු මහතා විසින් 1996.010.29 දින මැන සකස් කරන ලද අංක 301 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 02 යනුවෙන් හඳුන්වනු ලබන අක්කර බින්දුවයි, රූඩ් බිංදුවයි, පර්චස් විසිහතරයි දශම හයයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 24.60) ක් විශාල ඉඩමට ඉහත කී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : ඒ. ආර්. ඒල ලතීෆ් මහාගේ බිරිඳ සාරා උම්මා මියට අයත් ඉඩම, නැගෙනහිරට : ඒ. සම්සුදීන් මයාට අයත් ඉඩම, දකුණට : එම්. එම්. කානුදීන් මයාගේ බිරිඳ රහුමා බීබී මියට අයත් ඉඩම හා ඒ. ආර්. එම්. සාලි

මහතාගේ බිරිඳ පජුනු උම්මා මහත්මියට අයත් ඉඩම, බටහිරට : පාර යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම් හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් වේ.

මෙම දේපළ ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 2007.09.18 වැනි දින D97/148 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ත්‍රිකුණාමලය.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ත්‍රිකුණාමලය.

09-915

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

පී. ඩී. ජයමාන්න/යූ. ජී. සී. ඩී. කරුණාරත්න,
ගිණුම් අංක : 0054 5000 0185.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 අගෝස්තු මස 04 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

"සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 20 වැනි දාතම හා අංක 699 දරන හා මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ යන අය විසින් ලියා සහතික කරන ලද 2005 ඔක්තෝබර් මස 13 දාතම හා අංක 938 දරන උකස් බැඳුම්කර මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසන්න ධර්මරත්න ජයමාන්න සහ උඩුමාලගල ගමගේ චාමිණී දමයන්ති කරුණාරත්න යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී ප්‍රසන්න ධර්මරත්න ජයමාන්න යන අය උකස්කරු වශයෙන් ද පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාහත් ලක්ෂ හාර දහස් හත්සිය අසූ දෙකයි ශත දහ නමයක (රු. 17,04,782.19) මුදලක් 2010 මැයි 13 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දාහත් ලක්ෂ හාරදහස් හත්සිය අසූ දෙකයි ශත දහ නමයක (රු. 17,04,782.19) මුදල ද 2010 මැයි 14 වැනි දින සිට අංක 699 සහ 938 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහතුන් ලක්ෂ පනස් හත් දහස් පන්සිය හතලිස් හතයි ශත හතලිස් එකක (රු. 13,57,547.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) හා තවත් රුපියල් දෙලක්ෂ තිස් දහසක (රු. 2,30,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 699 සහ 938 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී."

**ඉහත කී උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල ගුරුවට් හතර වටරක ග්‍රාමයේ පිහිටි "වටරක එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1999.03.03 දාතම හා අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 109 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ලොට් 2ඒ හී ලොට් 2ඩී, දකුණට : එම ඉඩමේ ලොට් 108 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 110 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.30) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඒ 593/213 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වටරක ග්‍රාමයේ පිහිටි "වටරක එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 110 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 111 සහ මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ එම ඉඩමේ ලොට් 109 දකුණට එම ඉඩමේ ලොට් 109 සහ 56 සහ බස්නාහිරට එම ඉඩමේ ලොට් 111 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.04) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඒ 593/214 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 සහ ලොට් 56 දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-1047/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඒ. පී. යූ. ජයවර්ධන.
ගිණුම් අංක : 1010 5319 9960.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 අගෝස්තු මස 04 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

"සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මැයි 07 දාතම හා අංක 980 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අජිත් ප්‍රසන්න උබේසිංහ ජයවර්ධන නොහොත් උබේසිංහ ජයවර්ධනගේ අජිත් ප්‍රසන්න යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්‍ෂ තිස් තුන් දහස් තුන්සිය හතලිස් එකයි ශත හැට පහක (රු. 2,33,341.65) මුදලක් 2010 ජනවාරි 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙලක්‍ෂ තිස් තුන් දහස් තුන්සිය හතලිස් එකයි ශත හැට පහක (රු. 2,33,341.65) මුදල ද 2010 ජනවාරි මස 06 දින සිට අංක 980 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්‍ෂ දහඅට දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත අසූ හතරක (රු. 2,18,373.84) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 980 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී."

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර ගෘවට් හතර මාකවිට සහ තල්පාවෙල පිහිටි "වෙඩිකාර ආරච්චිගේවත්ත, බොරළුකැටිය, වාහලබරියහේන, පරගහවත්ත, ලියනරත්නගණිතගේගෙදරවත්ත, කහටගහවත්ත, ගණිතගේ වාහලබෙරියවත්ත, පරණවත්ත, වැකඩහේනේවත්ත, දෙණිය, හේනවත්ත, කැටවැවඅඹගහදෙණිය, පොල්පැලකොරටුව, කුකුල්ලකොරටුව, පුංචියක්දෙස්සපදිංචිවත්ත, නැකතිගේ වත්ත, මෙස්ත්‍රිසායක්කාරගේ, මහවත්ත, විදාගමගේහේන, කෝන්ගහකොරටුව, කඳුකපුකැබැල්ල නොහොත් හිඳකැටිය කුඹුර" දැන් සියල්ල එක්ව "සනි සයිඩ් එස්ටේට්" යයි හඳුන්වනු ලබන යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2005.02.16 දාතම හා අංක 89/2005 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 91 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 92, 82, සහ 83 නැගෙනහිරට : මෙහි ලොට් 83 සහ 90, දකුණට : මෙහි ලොට් 90 සහ 42 සහ බස්නාහිරට : මෙහි ලොට් 42 සහ 92 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම අටයි පහක් (අ. 0, පර්. 0, පර්. 10.85) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ එකී අංක 89/2005 දරන පිඹුරට අනුවය.

බලයලත් මානකතැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2004.06.28 දාතම හා අංක 345/2004 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි උප බෙදුමක් සහ නැවත මිනුමක් වන එකී ලොට් 91 පහතින් විස්තර කොට ඇති පරිදි ය.

එකී මාකවිට සහ තල්පාවෙල පිහිටි "වෙඩිකාර ආරච්චිගේවත්ත, බොරළුකැටිය, වාහලබරියහේන, පරගහවත්ත, ලියනරත්න ගණිතගේගෙදරවත්ත, කහටගහවත්ත, ගණිතගේ වාහලබෙරියවත්ත, පරණවත්ත, වැකඩහේනේවත්ත, දෙණිය, හේනවත්ත, කැටවැව, අඹගහ, දෙණිය, පොල්පැලකොරටුව, කුකුල්ලකොරටුව, පුංචියක්දෙස්සපදිංචිවත්ත, නැකතිගේවත්ත, මෙස්ත්‍රිසායක්කාරගේ, මහවත්ත, විදාගමගේහේන, කෝන්ගහකොරටුව, කඳුකපුකැබැල්ල නොහොත් හිඳකැටිය කුඹුර" දැන් සියල්ල එක්ව "සනි සයිඩ් එස්ටේට්" යයි හඳුන්වනු ලබන යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2004.06.28 දාතම හා අංක 345/2004 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : කෝන්ගහවත්ත, කහටගහවත්තෙහි කොටසක්, මඩවල දෙණිය පිංකොරටුව සහ මාරගහවත්ත නැගෙනහිරට: මාරගහවත්ත, ගම් සභා පාර, මහපිංදෙණියගෙදරවත්ත, පාර සහ මහගෙදරවත්ත, ලොට් 4, ලොට් 2 වෙන්කරන ඇල, දකුණට : ඇල, දෙල්ගහහේන, බතලවත්ත, මහපිංදෙණියගෙදර වත්ත, පාර, මහගෙදරවත්ත සහ විදානගමගේහේන සහ බස්නාහිරට : කහටගහවත්තෙහි කොටසක්, කෝන්ගහවත්ත, වාහලබෙරියහේන, විදානගමගේහේන, විදානගමගේ කුඹුර සහ මහ පිංදෙණියගෙදර වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තිස්එකයි රූඩ් තුනයි පර්චස් තිස් පහයි දශම බිංදුයි තුනක් (අ. 31, රූ. 3, පර්. 35.03) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ එකී අංක 345/2004 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 510/09 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහතින් විස්තර කොට ඇති පරිදි බලයලත් මානකතැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2004.06.28 දාතම හා අංක 345/2004 දරන පිඹුරේ නිරූපිත ලොට් 4, එකී අංක 89/2005 දරන පිඹුරේ නිරූපිත ලොට් 42, 128, 62 1/2, 247, 319 දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-1047/5

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

අයි. ඩබ්ලිව්. ඒ. ටී. චමින්ද
ගිණුම් අංක : 0074 5000 1966

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 අගෝස්තු මස 04 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ජූලි 21 දාතම හා අංක 606 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන

ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉමාදූව වික්‍රම ආරච්චිගේ තුසිත චමින්ද යන අය බන්ධනදායින් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසි දෙලක්ෂ දොළොස් දහස් පන්සිය හැට දෙකයි ශත හතලිස් අටක (රු. 22,12,562.48) මුදලක් 2010 මැයි 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසි දෙලක්ෂ දොළොස් දහස් පන්සිය හැට දෙකයි ශත හතලිස් අටක (රු. 22,12,562.48) මුදල ද 2010 මැයි 15 දින සිට අංක 606 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි ලක්ෂ පනස් හය දහස් පන්සිය හතලිස් දෙකයි ශත අනූ දෙකක (රු. 20,56,542.92) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හතක් (7%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 606 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල උප දිසාපති කොට්ඨාසයේ බුත්තල වැදිරට කෝරළේ මුප්පනේ පිහිටි "කුමාරවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටියුඩර් එස්. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1987 ඔක්තෝබර් 28 දාතම හා අංක 844 (LRC S/398/ws/1) දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : එම ඉඩමේ ලොට් 3, නැගෙනහිරට : ලොට් 12 (පාර සඳහා වෙන්කිරීම), දකුණට : පාර සහ බස්නාහිරට : අංක 835 දරන පිඹුරේ ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20.) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව එල් 52/203 යටතේ මොනරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගයඃ-

එකී මුප්පනේ පිහිටි "කුමාරවත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 844 එකී (එල්. ආර්. සී. S/398/ws/1) දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 12 (පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 4 සහ නිවාස සඳහා මිනුම් දෙපාර්තමේන්තුවේ පරිශ්‍රයන්, නැගෙනහිරට : එෆ්. වී. පී. 172 හී කුමාරවත්ත හී ලොට් 80ඊ හී කොටසක් ලොට් 9, 10, 11 සහ ලොට් 2 දකුණට : ලොට් 3 (පාර) සහ බස්නාහිරට : එෆ් වී පී 172හි ලොට් 80ඊ හි කොටසක්, ලොට් 1 සහ 3, සහ ලොට් 4, 5, 6, 7, 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයක් (අ. 0, රූ. 0, පර්.39) විශාල ඉඩම් කොටස වෙළුම/පත්ඉරුව එල් 50/52 යටතේ මොනරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-1047/6

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එල්. ඩබ්ලිව්. එස්. පී. ධර්මසිරි
ගිණුම් අංක : 0021 5000 4740

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005 ජනවාරි මස 20 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

"සීමාසහිත සම්පත් බැංකුව නමින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එන්. එදිරිසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 1996 දෙසැම්බර් මස 12 දාතම හා අංක 9796 දරන හා 1997 නොවැම්බර් 27 දාතම හා අංක 10038 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුරාධපුර පූජාරාම මාවත අංක 946 හි පදිංචි ලියන වඩුගේ සුසන්ත ප්‍රියලාල් ධර්මසිරි යන අය බන්ධදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසි එක් ලක්ෂ හාර දහස් අටසිය තිස් එකයි ශත විසි හතරක (රු. 21,04,831.24) මුදලක් 2004 සැප්තැම්බර් 30 වැනි දිනට එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසි එක් ලක්ෂ හාර දහස් අටසිය තිස් එකයි ශත විසි හතරක (රු. 21,04,831.24) මුදල ද 2004 ඔක්තෝබර් මස 01 දින සිට අංක 9796 සහ 10038 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොළොස් ලක්ෂ පනස් දහසක (රු. 12,50,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%) බැගින් වූ පොළිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 9796 සහ 10038 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී."

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම්පළාත කනදර කෝරළේ තුලනෙ 247 හි අනුරාධපුර නගර සභා සීමාවන් තුළ අනුරාධපුර නව නගරය, 1 අදියර බැංකු වැඩබිමෙහි පිහිටි පොන්නරන්කුලම්කැලේ යැයි කියනු ලබන ඉඩමෙන් සර්වේයර් ජෙනරාල් විසින් සාදන ලද FUP A 2 හි ලොට් 442 යයි කියනු ලබන ඉඩමෙන් බලයලත් මානකතැන ටී. බී. ආරියසේන යන අය විසින් සාදන ලද 1993 මාර්තු 01 දාතම හා අංක 12/93 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : FUP A 2 හි ලොට් 441, නැගෙනහිරට : FUP A 2 හි ලොට් 218, දකුණට :FUP A 2 හි ලොට් 443 සහ බස්නාහිරට : FUP A 2 හි ලොට් 432 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0121 හෝ පර්චස් හතරයි දශම හතයි හතක් (අ. 0, රූ. 0 පර්. 4.77) විශාල ඉඩම් කොටස සමග වරිපනම් අංක 166 දරන, අංක 126 දරන ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ

වෙළුම/පත්ඉරුව A 356/244 යටතේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. සුදර්ශන්
සමාගම් ලේකම්.

09-1047/3

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ටී. එච්. එස්. කුමාර.
ගිණුම් අංක : 1072 5317 0194.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 අගෝස්තු මස 04 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

"සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩබ්ලිව්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් 20 දාතම හා අංක 768 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තුයියා හෙන්නදිගේ සරත් කුමාර යන අය බන්ධදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් තුන් ලක්ෂ විසි පන් දහස් අටසිය පනස් අටයි ශත අනූ පහක (රු. 33,25,858.95) මුදලද 2010 අප්‍රේල් 30 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් තිස් තුන් ලක්ෂ විසි පන්දහස් අටසිය පනස් අටයි ශත අනූ පහක (රු. 33,25,858.95) මුදල ද 2010 මැයි මස 01 දින සිට අංක 768 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි අට ලක්ෂ හැත්තෑ දහස් හාරසිය හැට හතරයි ශත දහසයක (රු.28,70,464.16) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 768 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී."

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවත් තුළ බටපොළ ග්‍රාමයේ පිහිටි "TP 118953 මත හිමිකම් කියන ඉසදමෙන්තඔව්ට සහ TP 118950 මත හිමිකම් කියන ඇත්බස්නාවේ වත්ත ඔව්ට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන පී. ඒ. ආර්. චන්ද්‍රසිරි යන අය විසින් සාදන ලද 1994.11.12 දාතම හා අංක 1192A දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 B වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1192 A දරන පිඹුරේ ලොට් 1 A, නැගෙනහිරට : කහව සිට බටපොල දක්වා ප්‍රධාන පාර, දකුණට : එම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : දොන් එස්. පී. ඉදෝරිස් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම (වෙල) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිඑකක් (අ. 0, රූ. 0, පර්. 21) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රචශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1192ඒ දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C 826/130 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-1047/2

---

### පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී- වත්තල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යෝජනා සම්මුතිය

ගණුදෙනුකරුගේ නම : මාරිමුත්තු සිවඥානම්-එම්. එස්. ටෙක්ස්ටයිල්ස් හි තනි අයිතිකරු.

වර්ෂ 2010 ක්වූ අගෝස්තු මස 25 වැනි දින පවත්වන ලද පෑන් ඒෂියා බැන්කිං කෝර්පරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව ද පහත දැක්වෙන පරිද්දෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී :-

"කලින් පෑන් ඒෂියා බැන්කිං කෝර්පොරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැංක් ලිමිටඩ් යනුවෙන් නම් කරන ලද ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බැංකිං කෝර්පොරේෂන් පීඑල්සී නමින් වූ, සියල්ලම මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ගොඩ්ප්‍රි කුරේ විසින් සහතික කරන ලද වර්ෂ 2004 ක්වූ මාර්තු මස 08 වැනි දිනැති අංක 5360 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, වර්ෂ 2006 ක්වූ අගෝස්තු මස 29 වැනි දිනැති අංක 5712 දරන ද්විතීයික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2007ක් වූ නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 5901 දරන තෘතියික උකස්කරය මත කළ යුතු වූ ගෙවීම් සිදු කිරීම (බස්නාහිර පළාතේ පළාත්බද ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඩබ්ලිව්/ඒ/51999 දරන අංකය යටතේ ලියාපදිංචි කර ඇති) එම්. එස්. ටෙක්ස්ටයිල්ස් යන නාමය, අභිධානය සහ ව්‍යාපාරය යටතේ තනි අයිතිකාරත්ව ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන මාරිමුත්තු සිවඥානම් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

රුපියල් අටලක්ෂ හතලිස් පන්දහසකුත් ශත දෙකක් වූ (රු.8,45,000.02) මුල් මුදල සහ වර්ෂ 2010 ක්වූ ජූනි මස 10 වැනි දින සිට පොලිය ද, වර්ෂ 2010 ක්වූ ජූනි මස 04 වැනි දින සිට රු. 4,15,000 ක් මත එක් වර්ෂයකට සියයට 25% ක අනුපාතය මත පොලිය ද සහ වර්ෂ 2010 ක්වූ ජූනි මස 11 වැනි දින සිට රු. 3,47,500 ක් මත එක් වර්ෂයකට සියයට 29% ක අනුපාතය මත පොලිය ද සහ රුපියල් එක් ලක්ෂ දහ නව දහස් හයසිය අසූ එකකුත් ශත දහ හතක් (රු. 1,19,681.17) මත වර්ෂ 2010 ක්වූ ජූනි මස 10 වැනි දින සිට එක් වර්ෂයකට සියයට 29% බැගින් වූ අනුපාතය මත පොලිය ද එකී අංක 5360, 5712 සහ 5901 දරන උකස් බැඳුම්කර මත ගෙවන දින තෙක් (මෙහි මින්මතු ඇතැම් තැනෙක බැංකුව යනුවෙන් සඳහන් කරනු ලබන) පැන් ඒෂියා බැංකිං කෝපරේෂන් පීඑල්සී වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

අයවිය යුතු රුපියල් නවලක්ෂ හැට හතර දහස් හයසිය අසූ එකකුත් ශත දහ නවයක් (රු. 9,64,681.19) වූ මුදල ද ඉහත කී දින සිට වෙන්දේසියේ දින තෙක් පොලිය ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි පිරිවැය සහ මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩාත් පූර්ණ වශයෙන් විස්තර කර ඇති බැංකුවට උකස් කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපතිට අවසර දී බලය පවරන ලෙස 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනාවක් සම්මත කරගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත හැඳල උප කාර්යාල සීමාවේ තිඹිරිගස්යාය ග්‍රාමයේ පිහිටි හැඳල පාරේ, වරිපනම් අංක 134/3 දරන වැලිඅමුණෙඕවිට හෙවත් පුංචිකුරුඳුවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්.බී.එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද වර්ෂ 2002 ක්වූ ජූනි මස 28 වැනි දිනැති අංක 4843 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එම ලොට් අංක 1ට මායිම්, උතුරට : අංක 44/1974 දරන පිඹුරේ ලොට් ඊ සහ හැඳල මාර්ගය ද, නැගෙනහිරට : මාර්ගය ද, දකුණට : එල්. එස්. ඒ. ඩී. එඩ්මන්ඩ් ගේ ඉඩම සහ බස්නාහිරට : එකී අංක 44/1974 දරන පිඹුරේ ලොට් බී, ඊ, ජී සහ එච් ද මායිම් වූ එහි පිහිටි ගහකොල, පලතුරු සහ සියලුම දේ සමග වන ප්‍රමාණයෙන් පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7.00) වන ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 890/213 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 44/1974 දරන පිඹුරේ ලොට් ඊ ලෙස සලකුණු කර ඇති මාර්ග අයිතිවාසිකම සහ එකී අංක 4843 දරන පිඹුරේ දැක්වෙන නැගෙනහිර මායිම හා සම්බන්ධ මාර්ග ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සුදත් නැලිගම
සහකාර කළමණාකරු - අයකරගැනීම්.

09-1028/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.